# 2021 අයවැය පිළිබඳ ප්‍රසිද්ධ වාර්තාව

## වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්තියට අනුකූලද යන්න පිළිබඳ ඇගැයීම

2021 මාර්තු

# 2021 අයවැය පිළිබඳ ප්‍රසිද්ධ වාර්තාව

## වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්තියට අනුකූලද යන්න පිළිබඳ ඇගැයීම

2021 මාර්තු

වෙරිටේ රිසර්ච් ආයතනයේ ආර්ථික විශ්ලේෂණ කණ්ඩායම විසින් මෙම වාර්තාව සම්පාදනය කරන ලදි. එම කණ්ඩායම අනූෂන් කපිලන්, දිනුක් ද සිල්වා, ලහිරි ජයසිංහ සහ උදාහිරුණි අතපත්තු යන අයගෙන් සමන්විත විය. මේ සඳහා සංස්කරණ සහාය ලබා දෙන ලද්දේ දේශාල් ද මැල්, නිශාන් ද මැල් සහ වෙන්යා ද සිල්වා විසිනි.

වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිදු කර තිබේද යන්න තක්සේරු කිරීමේ අරමුණින් ගත වූ කාලය තුළ වෙරිටේ රිසර්ච් ආයතනය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අයවැය වාර්තා සඳහා දායකත්වය ලබා දී තිබේ. මෙම විශ්ලේෂණයේ සංගතභාවය ආරක්ෂා කර ගැනීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම එම වාර්තාවල යොදාගත් ව්‍යුහයම අනුගමනය කිරීමට අප කටයුතු කර ඇත.

Copyright © 2021 Verité Research Pvt Ltd. සියලු හිමිකම් ඇවිරිණි.

2021 අයවැය පිළිබඳ ප්‍රසිද්ධ වාර්තාව : වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්තියට අනුකූලද යන්න පිළිබඳ ඇගැයීම. - කාළඹ : වෙරිටේ රිසර්ච්, 2021
පි. 66; සෙමී. 26.

ISBN 978-624-5514-06-9

i . 352.48095493 ඩිව් 23

1. අයවැය-ශ්‍රී ලංකාව
2. බදු-ශ්‍රී ලංකාව-රාජ්‍ය ප්‍රතිපත්ති

ISBN: 978-624-5514-06-9

ආසියානු කලාපය තුළ සමාජ සංවර්ධනය පිළබඳ දැනුම්වත්භාවය හා කතිකාවන් ප්‍රවර්ධනය කරන අතරම සම්මුති සංවාද හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු හා විශ්ලේෂණ ලබා දීමේ පුරෝගාමියා බවට පත් වීම වෙරිටේ රිසර්ච් ආයතනයේ ඉලක්කය වේ. අප ආයතනය ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලනය, නීතිය හා ජනමාධ්‍ය පිළිබඳ පර්යේෂණයන් හා කතිකාවන් වෙනුවෙන් සක්‍රීයව දායක වන අතරම දත්ත එක්රැස් කිරීම, තොරතුරුවල සත්‍යාසත්‍යභාවය විමසීම , උපාමාර්ගික සංවර්ධනය හා තීන්දු විශ්ලේෂණය ආශ්‍රිත සේවා ලබා දීමෙහි නිරත වේ.

නිර්දේශිත උපුටනය: වෙරිටේ රිසර්ච් (2021). 2021 අයවැය පිළිබඳ ප්‍රසිද්ධ වාර්තාව: වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්තියට අනුකූලද යන්න පිළිබඳ ඇගැයීම, කොළඹ: වෙරිටේ රිසර්ච්

ප්‍රමුඛ පද: රාජ්‍ය මූල්‍ය, 2021 අයවැය, ශ්‍රී ලංකාව, ප්‍රතිපත්ති ප්‍රමුඛතා, ප්‍රතිපාදන, බදුකරණ ප්‍රතිපත්ති

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ වෙබ් අවකාශයක් වන PublicFinance.lk හි පළ කෙරෙනු ඇත.
තවත් විදසුන් හා විශ්ලේෂණද මෙම වෙබ් අඩවියෙන් ලබාගත හැක: http://publicfinance.lk/

ඔබේ අදහස් විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න: publications@veriteresearch.org

# පටුන

**I කොටස: වාර්තාව පිළිබඳ හැඳින්වීම ...... 4**

පසුබිම ...... 5

සීමාවන් සහ සුදුසුකම් ...... 6

සමස්ත නිරීක්ෂණ ...... 7

**II කොටස: ආංශික වෙන්කිරීම් හා බදු ප්‍රතිපත්ති ...... 9**

1. සෞඛ්‍ය අංශය ...... 10
2. ආරක්ෂක අංශය ...... 15
3. යටිතල පහසුකම් අංශය ...... 19
4. වෙළඳ හා කර්මාන්ත අංශය ...... 32
5. පරිසර අංශය ...... 38
6. අධ්‍යාපන අංශය ...... 43
7. කෘෂිකර්ම, වාරිමාර්ග සහ ධීවර අංශය ...... 49
8. සමාජ සවිබලගැන්වීම් අංශය ...... 57

**III කොටස: තොරතුරු ප්‍රමිතීන් සහ නිසි සුපරීක්ෂාව ...... 62**

1. තොරතුරු ආශ්‍රිතව අවධානයට ලක් විය යුතු කරුණු ...... 63
2. වෙනත් ගැටලු ...... 63
3. අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අයවැය ආශ්‍රිත දුර්වලතා ...... 64

# I කොටස:
# වාර්තාව පිළිබඳ හැඳින්වීම

# පසුබිම

2021 සඳහා වූ අයවැය 2020 නොවැම්බර් 17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර බදු අය කර ගැනීම හරහා රාජ්‍ය අරමුදල් රැස්කර ගැනීමට අදාළ යෝජනා සහ වසර තුළ සිදු කෙරෙන වියදම් පිළිබඳ යෝජනා එමගින් දැක්වේ. විධායකය විසින් රජයේ මුදල් කළමනාකරණය කරගැනීමට අදාළ ප්‍රධාන සංරචක මෙම යෝජනා වෙතින් විදහා දැක්වේ. එම නිසා, අයවැයෙහි ඇතුළත් වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූලද යන්න ඇගැයීමට ලක් කිරීම වැදගත් වේ.

මෙය, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සමාන කාර්යභාරයක් ඉටු කෙරෙන, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් සම්පාදිත ප්‍රසිද්ධ වාර්තාවකි. 2020 දෙසැම්බර් මාසයේදී පළ කරන ලද මෙහි පළමු වාර්තාව මගින්, අයවැයට ඇතුළත් රාජ්‍ය මූල්‍ය, මුදල් හා ආර්ථික උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ තක්සේරුවක් හා විශ්ලේෂණයක් ලබා දේ. මෙම වාර්තාව, වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්ති රජයේ ප්‍රතිපත්තියට අනුකූලද යන්න පිළිබඳ ඇගැයීමක් ලබා දෙන 2021 අයවැය සම්බන්ධයෙන් පළ කෙරෙන දෙවන ප්‍රසිද්ධ වාර්තාව යි.

ප්‍රධාන වශයෙන්ම මෙම වාර්තාවේ සිදු කෙරෙන ඇගැයීම 2020 නොවැම්බර් 17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2021 වසර සඳහා වූ අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සහ අයවැය කතාවේ ඇතුළත් යෝජනාවලට අනුව වෙන් කර ඇති අමතර ප්‍රතිපාදන මත පදනම් වේ.

මහජනතාව සහ පාර්ලිමේන්තුව හා විධායකය ඇතුළු අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීමට අමතරව, අදාළ තොරතුරු වෙත පිවිසීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීමටත් අයවැය ඇස්තමේන්තු බිහි කිරීමට පාදක වන ක්‍රියාවලිය විෘත්තීකරණය කිරීමටත් මෙම ඇගැයීම දායක වේ. මධ්‍ය කාලීන පදනමක් තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට හේතු වන පරිදි වඩා හොඳින් රාජ්‍ය අයවැය පිළියෙල කිරීමට මෙය හේතුපාදක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# සීමාවන් සහ සුදුසුකම්

මෙම ඇගැයීමට අදාළ වන ඇතැම් සීමාවන් සහ සුදුසුකම් සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ආරම්භයේදීම අවධානය යොමු කරයි. මෙම සීමාවන් ගත වූ වර්ෂය පුරාවටද දක්නට හැකි විය.

පළමුව, රජයේ විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අතරෙහි අයවැය ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ කෙසේද යන්න පිළිබඳ විස්තර මෙම වාර්තාව පිළියෙළ කිරීමට පදනම ලෙස යොදාගෙන ඇති පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති විසර්ජන පනත් කෙටුම්පතට (අයවැය පළමුවර කියවීම) අන්තර්ගත නොවේ. මේ නිසා, විසර්ජන පනත් කෙටුම්පත පමණක් පදනම් කරගෙන මෙම තක්සේරුව කළ හැකි නොවේ.

දෙවනුව, විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවූ අවස්ථාවේදී පාර්ලිමේන්තුව වෙත ලබා දී තිබුණු විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු ඒවාට අදාළ අයවැය කතාවේ සඳහන් සංඛ්‍යාවන්ගෙන් සැලකිය යුතු ලෙස වෙනස් වේ. කෙසේ වෙතත්, සියලුම අමාත්‍යාංශ හා වැය ශීර්ෂවල වියදම් හා සම්බන්ධ සවිස්තර තොරතුරු ලබා දෙන එකම ලේඛනය වන්නේ අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් පමණක් වන හෙයින් එය මෙම විශ්ලේෂණය සඳහා යොදාගෙන තිබේ.

තුන්වනුව, වියදම් වාර්තා කරනු ලැබෙන්නේ අමාත්‍යධූරවලට අදාළව පමණක් මිස ආංශික වර්ගීකරණ ඇසුරින් නොවීමත් ශ්‍රී ලංකාව තුළ එවැනි ධූරයන් බෙහෙවින්ම වෙනස්වීමට ලක් වීම හා කැබිනට් අමාත්‍ය මණ්ඩල සංයුතිය වෙනසට ලක් වීමත් සමගින් ඒවා ප්‍රතිසංවිධානයන්ට ලක් වීමේ ඇති නැඹුරුවත් යන හේතු දෙකම නිසා විශේෂිත අංශවලට අදාළව වියදම් හඳුනාගැනීම අතිශයින්ම අභියෝගකර අභ්‍යාසයකි.

මේ නිසා, මෙම වාර්තාවේ විෂය පරාසය එකී සීමාවන්ගේ බලපෑමට ලක් වේ. වඩාත් අදාළ වන අතීත ආංශික හා අමාත්‍යාංශ වියදම් ඉදිරිපත් කිරීමට මෙම වාර්තාවේ කර්තෘවරුන් හැකි සෑම අවස්ථාවකදීම ප්‍රයත්න දරා ඇති නමුදු විශ්වසනීය සංඛ්‍යාවන් ලබා ගැනීමට නොහැකි වීම මත ඇතැම් ගැලපුම් නිසා යම් යම් වැය ශීර්ෂවල සංඛ්‍යාවන් අධි හෝ අව ඇස්තමේන්තුගත වීමට ඉඩ ඇති බවද කිව යුතු ය.

# සමස්ත නිරීක්ෂණ

වාර්ෂික අයවැය විවාදය හා එය අනුමත කරගැනීම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අතිශය වැදගත් ක්‍රියාවලියකි. රජය පැත්තෙන් බැලූ විට රටේ සංවර්ධනය හැසිරවීම උදෙසා තමන් අනුගමනය කිරීමට අදහස් කරන නව ප්‍රතිපත්ති හා විධිවිධාන ප්‍රකාශයට පත් කිරීමට ඇති ඉතාම වැදගත් අවස්ථාව වන්නේද එය යි. කෙසේ වෙතත්, එවැනි සෑම සැලසුමක්ම මගින් රාජ්‍ය මූල්‍ය කටයුතු කෙරෙහි බලපෑමක් එල්ල වීම සිදු විය හැක. මේ නිසා, අවසන් වශයෙන් අනුමත කෙරෙන, අයවැයෙහි දක්වා ඇති කාරණා සියල්ලම රටට බෙහෙවින් වැදගත් වේ. ප්‍රජාතන්ත්‍රවාදය හොඳින් ක්‍රියාත්මක වන රටක රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය හා එහි ප්‍රතිඵල පිළිබඳ කාර්යක්ෂම මහජන සහභාගීත්වයක් පැවතිය යුතුය.

රජයේ වියදම් සඳහා වෙන් කෙරෙන ප්‍රතිපාදන හා බදුකරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණවත් බව, විශ්වසනීයත්වය හා ප්‍රමුඛතා මෙන්ම ඒවා කෙතරම් දුරට රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වන්නේද යන්න අවබෝධ කරගැනීම සඳහා පිටුවහලක් මෙම වාර්තාව මගින් මහජනතාව හා අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ලබා දෙනු ඇත. එහිදී, පාර්ලිමේන්තුව ඇතුළු පාර්ශ්වකරුවන් හට වැඩිදියුණු කිරීම් සිදු කළ යුතු ක්ෂේත්‍ර කවරේද යන්න අවබෝධ කරගැනීමටත් එලෙස අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා රජයේ විධායකය පෙළඹවීම සඳහා ඉඩකඩක්ද මෙම ඇගැයීම  මගින් සැලසේ.

මෙම වාර්තාවේ ඇතුළත් ඇගැයීමට අදාළ වන සීමාවන් සහ සුදුසුකම් අවධානයට ලක් කෙරෙන මෙහි I කොටස මගින් මූලික සොයාගැනීම්වල සාරාංශයක් ලබා දේ. වාර්තාවෙහි ඇතුළත් ප්‍රධානතම විශ්ලේෂණය II සහ III කොටස්වල දැක්වේ. අතිරේක තොරතුරු ලබා දෙන ඇමිණුමක් ඉන් අනතුරුව ඇතුළත් කර ඇත.

මෙම වාර්තාවේ II කොටස මගින් රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවලට අදාළ අංශ අටක් හඳුනා ගැනෙන අතර, 2021 සඳහා පාර්ලිමේන්තුවට යෝජිත අයවැය එකී ප්‍රමුඛතාවලට අනුකූලද නැද්ද යන්න ඇගැයීමට ලක් කෙරේ. එලෙස ඒ ඒ අංශය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රමුඛතා හඳුනාගෙන ඇත්තේ මුදල් අමාත්‍යාංශයේ අන්තර්ජාල අඩවියෙහි පළ කර ඇති “සෞභාග්‍යයේ දැක්ම” නිල ජාතික ප්‍රතිපත්ති රාමුව උපයෝගී කොටගෙන ය.

ඒ අනුව මෙම වාර්තාවෙහි පහත අංශ පිළිබඳව විශ්ලේෂණයක් සිදු කර ඇත:

1. සෞඛ්‍ය
2. ආරක්ෂක
3. යටිතලපහසුකම්
4. වෙළෙඳ හා කර්මාන්ත
5. පරිසර
6. අධ්‍යාපන
7. කෘෂිකර්මාන්තය, වාරිමාර්ග සහ ධීවර කර්මාන්තය
8. සමාජ සවිබලගැන්වීම සහ ආරක්ෂාව

මෙම වාර්තාව මගින් ඉහත ඒ ඒ අංශයට අදාළ රජයේ වියදම් හා බදු ප්‍රතිපත්ති ආශ්‍රිත ප්‍රවණතා විමර්ශනය කෙරෙන අතර විශේෂ කාරණා අවධානයට ලක් කරමින් අදාළ අවස්ථාවලදී අතීත අත්දැකීම්ද සාකච්ඡා කරමින් දත්ත පාදක විශ්ලේෂණ හා නිරීක්ෂණ ලබා දේ.

අයවැය තොරතුරු හා හෙළිදරව් කිරීම්වලදී අදාළ වන "තොරතුරු ප්‍රමිති හා නිසි සුපරීක්ෂාව" පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා එම කාරක සභාව මගින් අවධානයට ලක් කළ ගැටළු මෙම වාර්තාවේ III කොටස මගින් දැක්වේ. එම මාතෘකා යටතේම 2019 අයවැය සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් පළ කරන ලද සිය පළමු වාර්තාවේදී හඳුනාගෙන ඇති ගැටළුවලටම ඉහත කරුණුද එක් කෙරේ. මෙම කොටස ඛණ්ඩ දෙකකින් සමන්විත ය: (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් අයවැය සම්බන්ධයෙන් ඊට පෙරාතුවද මතු කර ඇති ගැටළු සමාලෝචනය කිරීම, (2) අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අයවැය ආශ්‍රිත දුර්වලතා.

2021 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත, 2021 අයවැය කතාව, මින් පෙර ඉදිරිපත් කර ඇති අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික වාර්තා වෙතින් ලබාගත් දත්ත මෙම වාර්තාව පිළියෙළ කිරීම සඳහා යොදාගෙන තිබේ.

# II කොටස: ආංශික වෙන්කිරීම් හා බදු ප්‍රතිපත්ති

අංශ සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන/වියදම් කිරීම් තක්සේරු කිරීම සඳහා පාර්ලිමේන්තුවට අවශ්‍ය වන සවිස්තරාත්මකභාවය පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අයවැය ඇස්තමේන්තු මගින් නොසැපයේ. මීට හේතුව වන්නේ පළාත් සභා (සහ අනෙකුත් උප-ජාතික රජයයන්) විසින් සිදු කෙරෙන වියදම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව වෙතින් සිදු කෙරෙන සමුච්චිත මුදල් පැවරීම් පිළිබඳ මිස එකී ප්‍රතිපාදනවලට අදාළ පූර්ණ ආංශික බෙදීයාම නොවීම ය.

එපමණක්ද නොව, ආංශික වශයෙන් වර්ගීකරණය කරන ලද අයවැය තොරතුරු 2019 අයවැයෙහි ඇතුළත් කර තිබුණද, 2020 හෝ 2021 අයවැය සඳහා එවැනි තොරතුරු ඇතුළත් නොවේ. රජයේ ප්‍රතිපත්තිමය සීමාවන්ට අනුගතව මුදල් වෙන්කොට තිබේද යන්න වාර්තා කිරීම උදෙසා, ගිණුම්කරණ වර්ගීකරණයේදී අමාත්‍යාංශධූර තුළ විවිධ වියදම් ප්‍රවාහ තෝරාගැනීම හරහා එක් එක් අංශයක් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ආසන්න අගයකට ගණනය කර ගැනීම අවශ්‍ය වේ. මෙය වනාහි මෙම කොටසෙහි සාකච්ඡාවට බඳුන් කෙරෙන චේක්‍යයන්ට අදාළ ඇතැම් සීමාවන් බිහි වීමට හේතු වන අසම්පූර්ණ ක්‍රමවේදයකි.

දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස වියදම් ගණනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ද.දේ.නි. ඇස්තමේන්තු යොදාගෙන ඇත. මේ අනුව, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2020 වසර සඳහා සියයට ධන 1.5 ක් ද 2021 වසර සඳහා සියයට ධන 5.5 ක් ද වේ. උද්ධමනය මැද තනි ඉලක්කමක අගයක් ලෙස ස්ථායීව පවත්වා ගැනීමේ රජයේ අපේක්ෂාවට අනුකූල වන පරිදි එම වර්ෂ දෙකම සඳහා උද්ධමනය සියයට 5 ක් ලෙස උපකල්පනය කර ඇත.

# 1. සෞඛ්‍ය අංශය

මෙම කොටසේදී ආවරණය කෙරෙන සෞඛ්‍ය අංශයේ ප්‍රතිපාදනවලට ඇතුළත් වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කර ඇති මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය වියදම් පමණි. සෞඛ්‍ය අමාත්‍යාංශයට රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් අයත් වේ: (1) දේශීය වෙදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය, සහ (2) ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමය රාජ්‍ය අමාත්‍යාංශය. සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ රාජ්‍ය අමාත්‍යාංශ දෙක සහ ණය අයවැය යෝජනාවල වියදම් වෙන්කොට ඇති ආකාරය පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යාලේඛන 1.1 ප්‍රදර්ශිතයෙහි දක්වා ඇත.

## සෞඛ්‍ය අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන (රජයේ වියදම්වලට සමානුපාතිකව) 2019 ට වඩා ආන්තික වශයෙන් අඩු වටිනාකමක් ගනී

**1.1 ප්‍රදර්ශිතය:** සෞඛ්‍ය අංශයේ වියදම් සාරාංශය *(වටිනාකම රු. බිලියනවලින්)*

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **සෞඛ්‍ය අංශය** | 190 | 227 | 235 | **3.2%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *6.43%* | *6.41%* | *6.20%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *1.3%* | *1.4%* | *1.3%* | |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 188.6 (6.37%) | 159.6 (4.49%) | 159.5 (4.21%) | -0.06% |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 0.6 (0.02%) | 0.6 (0.02%) | 0.7 (0.02%) | 15.8% |
| දේශීය වෙදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය | 1.7 (0.06%) | 2.0 (0.06%) | 2.6 (0.07%) | 35.6% |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 1.7 (0.06%) | 1.8 (0.05%) | 2.2 (0.06%) | 24.3% |

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 65.9 (1.86%) | 61.2 (1.61%) | -7.2% |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂ අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 11.5 (0.30%) | දත්ත නොමැත |


*වරහන් තුළ දැක්වෙන සංඛ්‍යාවන් රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස වටිනාකම් දක්වයි.*

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ.. පුද්ගල කේන්ද්‍රීය සෞඛ්‍ය සේවා (රු. බිලියන 10) සහ ළදරුවන් හා ගර්භණී මාතාවන් (රු. බිලියන 1.5) සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## මීට ඉහත ප්‍රාග්ධන වියදම් ප්‍රමාණවත් පරිදි භාවිතයට ගෙන නොමැත

**1.2 ප්‍රදර්ශිතය:** සෞඛ්‍ය අංශය සඳහා වැය කළ මුදල්, රු. බිලියනවලින්, 2015-2019




*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු (විවිධ වසරවල)*

## සෞඛ්‍ය අංශය සඳහා වෙන් කරනු ලැබෙන ප්‍රතිපාදන වියදම් කිරීමට නැඹුරු වන්නේ මඳ වශයෙනි: විශේෂයෙන්ම ආයුර්වේද අංශය සම්බන්ධයෙන් මෙය වඩාත් උග්‍ර වේ

**1.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව තථ්‍ය වියදම්වල) |
|---|---|---|
| **සෞඛ්‍ය අංශය** | **9.8%** | **15.7%** |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 4.0% | 21.2% |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 5.0% | 9.9% |
| අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති අනෙකුත් ප්‍රතිපාදන | 9.9% | 15.6% |

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු (විවිධ වසරවල)*

### විශ්ලේෂණය

2021 වසර සඳහා මධ්‍යම ආණ්ඩුව විසින් සෞඛ්‍ය අංශය සඳහා වෙන්කර ඇති මුදල රු. බිලියන 235 කි. මෙය රජයේ වියදම්වලින් සියයට 6.43 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.3 කට සමාන වන්නකි.

ගත වූ වර්ෂය හා සැසඳීමේදී, සෞඛ්‍ය අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ඉහළ ගොස් ඇත්තේ ඉතාම සුළු වශයෙන් - එනම්, සියයට 3.2 කින් - වන අතර ගත වූ වසර පහක කාලය තුළ එහි වර්ධනයේ සාමාන්‍යය සියයට 9.8 ක් ලෙස පැවත තිබේ. කෙසේ වෙතත්, 2019 තථ්‍ය වියදම් සමඟ සංසන්දනය කිරීමේදී 2020 සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ආසන්න වශයෙන් සියයට 19.5 කින් පමණ ඉහළ ගොස් ඇති බව පෙනී යයි. රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස සෞඛ්‍ය අංශය සඳහා වෙන් කර ඇති මුදල් 2019 ට සාපේක්ෂව ආන්තික වශයෙන් අඩු වී තිබේ.

කෙසේ වෙතත්, සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් ගත වූ වසරවල දී රජය විසින් පෙන්නුම් කර ඇත්තේ දුර්වලබවකි. පුනරාවර්තන වියදම් සමග සංසන්දනය කිරීමේදී වියදම් ආශ්‍රිත විශාලතම විචලනය උද්ගතව ඇත්තේ ප්‍රාග්ධන වියදම්වලට අදාළව ය. වියදම්වලට අදාළ හිඟ මුදලේ වාර්ෂික සාමාන්‍යය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 15.7 ක් වන අතර අඩුවෙන්ම ප්‍රතිපාදන වියදම් කර ඇත්තේ ආයුර්වේද දෙපාර්තමේන්තුවයි.

## 1.4 ප්‍රදර්ශිතය: 2021 රාජ්‍ය අයවැයට සාපේක්ෂව රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්ති රාමුව

සමස්ථයක් ලෙස ගත් කල, 'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්ති සියල්ලම සඳහා මුදල් වෙන් කොට ඇති බව පෙනී යයි. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණවත් නොවේ. සෞඛ්‍ය අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 1.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**1.4 ප්‍රදර්ශිතය:** 2021 රාජ්‍ය අයවැයට සාපේක්ෂව රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව | නිරීක්ෂණවල සාරාංශය |
|---|---|---|
| 1 | සෞඛ්‍යසේවා සංවර්ධන පහසුකම් වැඩිදියුණු කිරීම | සෞඛ්‍යසේවා සංවර්ධනය යටතේ ඇති ප්‍රධාන ප්‍රතිපත්ති යෝජනා බොහොමයක් සඳහා ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන වෙන් කර තිබේ. කෙසේ වෙතත්, ඇතැම් යෝජනා සම්බන්ධයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ඒ සඳහා ප්‍රමාණවත් නොවේ.<br><br>අයවැය යෝජනාද ඇතුළත්ව 2021 වසරේදී රෝහල් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මිලියන 30,312 ක් වෙන් කර ඇත. මෙය, 2020 සඳහා වූ සංශෝධිත අයවැයෙහි දක්වා ඇති වටිනාකමට වඩා රු. මිලියන 971 කින් වැඩි සහ 2019 තථ්‍ය වියදම්වලට වඩා රු. මිලියන 16,635 කින් වැඩි අගයකි. |
| 1.1 | ශ්‍රී ලංකා ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කිරීම සහ සෑම දිස්ත්‍රික්කයකම ඇති සියළුම රෝහල් ජාතික රෝහලේ මට්ටමට ඉහළ නැංවීම. | ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට නගා සිටුවීම උදෙසා රු. මිලියන 510 ක් වෙන් කර තිබේ. කෙසේ වෙතත්, එම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 14,600 කි.<br><br>සෑම දිස්ත්‍රික්කයකම ඇති රෝහල් සියල්ලම ජාතික රෝහලේ තත්ත්වයට ඉහළ නැංවීමේ ප්‍රතිපත්තිය වෙනුවෙන් රු. මිලියන 250 ක මුදලක් වෙන් කර ඇති අතර මෙම මුළු මුදලම වෙන් කර ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි එක් රෝහලක් වෙනුවෙන් වියදම් කිරීම සඳහා ය. |
| 1.2 | අවශ්‍ය පහසුකම්, භෞතික මෙන්ම මානව සම්පත් ලබා දීම තුළින් සියලුම රෝහල්වල තත්ත්වය ඉහළ නැංවීම. රෝගීන් වෙනත් රෝහල්වලට යොමු කිරීමේ පද්ධතියක් හඳුන්වා දෙන අතරම සියලුම බාහිර රෝගී සේවා මෙම රෝහල්වල පිහිටුවීම. | 2021 දී මෙම ක්‍රියාදාමය වෙනුවෙන් රජය රු. මිලියන 7,945 ක මුළු මුදලක් වෙන් කර තිබුණි. 2020 සංශෝධිත අයවැය ඇස්තමේන්තු හා සැසඳීමේදී ඇතැම් උප කාණ්ඩ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණ ඉහළ ගොස් ඇති නමුදු එය 2019 තථ්‍ය වශයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලට වඩා අඩු වේ. |
| 1.3 | ඊ-සෞඛ්‍ය, දුරස්ථ ප්‍රතිකාර (ටෙලිමෙඩිසින්) ආදී නවීන රෝග නිශ්චය හා ප්‍රතිකාර තාක්ෂණික පහසුකම් හඳුන්වා දීම. | වෙන් කර ඇති ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තියේ අභිලාෂයන් ඉටු කිරීම සඳහා සෑම විටම ප්‍රමාණවත් නොවේ. නිදසුනක් ලෙස, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හරහා ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල විද්‍යුත් වෛද්‍ය වාර්තා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වෙන් කර ඇති මුදල රු. මිලියන 100 කි. කෙසේ වෙතත්, අනෙකුත් නවීන රෝග විනිශ්චය/ප්‍රතිකාර තාක්ෂණයන් සඳහා වෙන් කර ඇති මුදල් පිළිබඳ කිසිදු සඳහනක් හමු නොවේ. |
| 1.4 | ඖෂධවල තත්ත්වය සහතික කරනු පිණිස ප්‍රමාණවත් ලෙස උපකරණ සහිත ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූල වන තත්ත්ව පාලන විද්‍යාගාරයක් පිහිටුවීම. | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූල වන තත්ත්ව පාලන විද්‍යාගාරයක් පිහිටුවීම වෙනුවෙන් **ප්‍රතිපාදන වෙන් කර නොමැත**. |
| 2 | වෛද්‍යවරුන් රට තුළ රඳවා ගැනීම සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම. | මේ වෙනුවෙන් 2021 සඳහා වෙන් කර ඇති මුදල් 2019 ට වඩා අඩු වුව ද 2020 ට වඩා වැඩි ය. වෛද්‍යවරුන් සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ වෙනත් වෘත්තිකයන් හට අදාළව පහසුකම් වැඩිදියුණු කිරීමසඳහා 2021 අයවැය මඟින් රු. බිලියන 1,579 ක් වෙන් කර ඇති අතර 2020 දී මේ වෙනුවෙන් රු. බිලියන 1,182 ක් ද 2019 දී රු. බිලියන 1,831 ක් ද වෙන් කර තිබුණි. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව | නිරීක්ෂණවල සාරාංශය |
|---|---|---|
| 3 | අත්‍යවශ්‍ය ඖෂධ සහ සැපයුම් සඳහා  අනිවාර්ය ආරක්ෂිත තොග මට්ටම් පවත්වා ගැනීම. | 2020 වසරේදී රු. මිලියන 65,914 ක් ලෙස පැවැති වෛද්‍ය සැපයුම් අංශය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන 2021 දී රු. මිලියන 61,118 දක්වා අඩු වී තිබේ. කෙසේ වෙතත්, ඒ සඳහා 2021 වෙන් කර ඇති ප්‍රතිපාදන 2019 සඳහා වූ තථ්‍ය වියදම වන රු. මිලියන 54,595 ටවඩා වැඩි වේ. |
| 4 | ගර්භණී කාන්තාවන්ගේ සහ ළදරුවන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම පිණිස "නව පෝෂණ ආධාර වැඩසටහනක්" ක්‍රියාත්මක කිරීම | 2019 වසරේදී රු. මිලියන 2,275 ක වටිනාකමින් යුතු වූ ප්‍රතිපාදන 2021 දී රු. මිලියන 4200 දක්වා ඉහළ ගොස් තිබේ. මේ අනුව 2021 දී එම ප්‍රතිපාදන සියයට 85 කින් ඉහළ ගොස් ඇත. අයවැය කතාව මගින් වෙන් කළ රු. බිලියන 1.5 ද මීට ඇතුළත් වේ. කෙසේ වෙතත්, 2020 වසර සඳහා මේ වෙනුවනේ වෙන් කර තිබූ මුදල රු. මිලියන 1,638 ක් පමණක් විය. |
| 5 | පහත කාරණාද ඇතුළත්ව දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා වාර්ෂිකව වෙන් කරන ප්‍රතිපාදන වැඩි කිරීම:<br>- ආයුර්වේද රෝහල් එක් පිළිගත් මට්ටමකට වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම<br>- රෝග නිවාරණ සත්කාර ලබා දීම<br>- ආයුර්වේද වෛද්‍යවරුන් හට පහසුකම් ලබා දීම<br>- දේශීය ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම<br>- සියලුම ඖෂධීය ශාබ, ඔසු උයන් වගා කිරීම උදෙසා පහසුකම් ලබා දීම සහ ඖෂධීය රූපලාවන්‍ය නිෂ්පාදන සිදු කිරීම හා ආනයනය කිරීම සඳහා පහසුකම් සැලසීම | දේශීය වෙදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුළු මුදල 2021 දී රු. මිලියන 2,649 ක් වේ. මෙය, 2020 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව සමග සැසඳීමේදී සියයට 36 ක වැඩි වීමක් වන අතර 2019 තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 54 ක වැඩි වීමකි.<br>දේශීය වෛද්‍ය ශිල්පය වෙනුවෙන් හඳුන්වා දෙන  විශේෂිත ප්‍රතිපත්ති සඳහා වෙන් කරන ප්‍රතිපාදනදගත වූ වර්ෂවලට සාපේක්ෂව ඉහළ ගොස් තිබේ. |

# 2. ආරක්ෂක අංශය

ආරක්ෂක අංශය වෙනුවෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදන අතරට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින විශේෂිත වැය ශීර්ෂද ද ඇතුළත් වේ. මේ අතරට ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වෙන් කෙරෙන අනෙකුත් අංශ අයත් වේ. ආරක්ෂක මෙහෙවරට අයත් නොවන වැය ශීර්ෂ වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව, පරිපාලන සහ ආයතනික සේවා (නීතිය හා සාමය), විශේෂ කාර්ය බලකාය සහ ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය යනාදිය මින් බැහැර කර තිබේ. අයවැය ඇස්තමේන්තුවල සඳහන් මුදල් වටිනාකම්වලට අමතරව, ආරක්ෂක අංශය වෙනුවෙන් අයවැය කතාව මගින් වෙන් කර ඇති ප්‍රතිපාදනද 2021 අයවැය ඇස්තමේන්තුවල අන්තර්ගත කර ඇත.

### 2021 වසර සඳහා ආරක්ෂක අංශය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන රු. බිලියන 46 කින් ඉහළ ගොස් ඇත

**2.1 ප්‍රදර්ශිතය:** ආරක්ෂක අංශයේ වියදම් සාරාංශය (*වටිනාකම රු. බිලියනවලින්*)

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **ආරක්ෂක අංශය** | **295.6** | **303.0** | **348.4** | **15.0%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *9.99%* | *8.53%* | *9.20%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *1.97%* | *1.89%* | *1.98%* | |
| ආරක්ෂක අමාත්‍යාංශය* | 295.6 (9.99%) | 303.0 (8.53%) | 327.7 (8.65%) | **8.2%** |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | 155.3 (5.25%) | 164.6 (4.64%) | 169.8 (4.48%) | **3.2%** |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 56.4 (1.91%) | 56.4 (1.59%) | 61.6 (1.62%) | **9.2%** |


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 39.6 (1.34%) | 44.2 (1.25%) | 51.6 (1.36%) | **16.7%** |
| සිවිල් ආරක්ෂක දෙපාතර්මේන්තුව | 16.8 (0.57%) | 19.2 (0.54%) | 19.3 (0.51%) | **8.6%** |
| ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුව | 0.3 (0.01%) | 0.2 (0.01%) | 0.3 (0.01%) | **27.5%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 20.8 (0.55%) | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ. ජාතික ආරක්ෂාව සඳහා වෙන් කළ මුදල් (රු. මිලියන 20,000) සහ යුධ විරුවන් සඳහා වූ වැඩසටහන් සඳහා වෙන් කළ මුදල් ද (රු. මිලියන 750) 2021 අයවැය යෝජනා අතරට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## 2019 දී සිදු වූ 4.6% ක වර්ධනය හැරුණු විට ආරක්ෂක වියදම් විශාල වශයෙන්ම නොවෙනස් ව පැවත ඇත

**2.2 ප්‍රදර්ශිතය:** ආරක්ෂක අංශය සඳහා වැය කරන ලද මුදල්, රු. බිලියනවලින්, 2015-2019



## වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුව හැරුණු කොට අනෙකුත් ආයතනවල තථ්‍ය වියදම් බොහෝ දුරට වෙන් කරන ලද ප්‍රතිපාදන සමඟ ගැලපේ

**2.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වාර්ෂික වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවල සත්‍ය වියදම් කොටස) |
|---|---|---|
| **ආරක්ෂක අංශය** | **0.04%** | **6.02%** |
| ශ්‍රී ලංකා යුද හමුදාව | -0.39% | 4.86% |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | -0.13% | 4.16% |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | -4.17% | 8.49% |
| සිවිල් ආරක්ෂක දෙපාතර්මේන්තුව | -0.69% | 4.26% |
| ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුව | 106.90% | 17.96% |

### විශ්ලේෂණය

2021 වසරේදී මධ්‍යම ආණ්ඩුව වෙනුවෙන් ආරක්ෂක අංශය සඳහා වෙන්කර තිබුණු මුදල රු. බිලියන 348 ක් විය. මෙය රජයේ වියදම්වලින් සියයට 9.55 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.98 කට සමාන වන්නකි.

2021 වසරේදී ආරක්ෂක අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 2020 සංශෝධිත ඇස්තමේන්තු සමග සැසඳීමේ දී සියයට 15 කින් ඉහළ ගොස් තිබේ. ගත වූ වසර පහක කාලය තුළ ආරක්ෂක අංශය සඳහා වෙන් කළ මුදල් ප්‍රතිපාදනවල වැඩිම ඉහළ යාම දක්නට ලැබෙන්නේ 2021 ට අදාළ ප්‍රතිපාදන ආශ්‍රිතව ය. 2015 සහ 2019 අතර කාලයේදී ආරක්ෂක අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල වාර්ෂික වර්ධනයේ සාමාන්‍යය සියයට 0.04 ක් වන අතර ප්‍රධාන වශයෙන් ම මීට හේතු වී ඇත්තේ 2016 වසරේදී වෙන් කළ මුදල් සියයට 8.8 කින් කපා හැරීම යි.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන, රජයේ මුදල් සම්පාදනය අවශ්‍ය වන ප්‍රතිපත්ති සියල්ලම සඳහා මුදල් වෙන් කොට ඇති බව පෙනී යයි. ආරක්ෂක අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් ඒ හා සබැඳි නිරීක්ෂණ පහත 2.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**2.4 ප්‍රදර්ශිතය:** 2021 රාජ්‍ය අයවැයට සාපේක්ෂව රජයේ ආරක්ෂක ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 1 | බුද්ධි සේවා සවිමත් කිරීම | **වෙන් කරන ලද ප්‍රතිපාදන සියල්ල මෙම ප්‍රතිපත්තිය සමඟ මනාව ගැලපේ.** රාජ්‍ය බුද්ධි සේවා වෙනුවෙන් 2020 වසරේදී වෙන් කර තිබූ මුළු මුදල වූ රු. මිලියන 1,779 2021 දී රු. මිලියන 1,994 දක්වා ඉහළ ගොස් ඇති අතර මෙය සියයට 12 ක ඉහළ යාමකි. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්‍ෂණ |
|---|---|---|
| 1.1 | දේශීයව සහ විදේශීයව නවීන පුහුණුව ලබා දීම | 2020 දී රු. මිලියන 0.74 ක් සහ 2019 දී රු. මිලියන 1.7 ක් ලෙස පැවැති **කාර්ය මණ්ඩල පුහුණු අයවැය** රු. මිලියන 2.5 දක්වා ඉහළ ගොස් ඇත. |
| 1.2 | නවීන තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිත කිරීමට අදාළව පුද්ගලයන් දිරිගැන්වීම | **ප්‍රධාන වශයෙන්ම උපකරණ ඇතුළු ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් වෙන් කර ඇති අයවැය** 2019 දී රු. මිලියන 8 ක් හා 2020 දී රු. මිලියන 36 ක් වූ අතර එය 2021 දී රු. මිලියන 55 දක්වා වැඩි කර තිබේ. |
| 2 | වැටුප්, දීමනා සහ උසස්වීම් ආශ්‍රිත විෂමතා ඉවත් කිරීම සහ 2009 වසරට පෙර සක්‍රීය සේවයේ නිරතව සිටි එහෙත් උසස් වීම් ප්‍රමාද වූ සන්නද්ධ බලකා සාමාජිකයන් හට වන්දි ගෙවීම. | වැටුප් විෂමතා ඉවත් කර තිබේ ද යන්න පිළිබඳ අයවැය ඇස්තමේන්තු හරහා පැහැදිලි අදහසක් නොලැබේ. කෙසේ වෙතත්, 2020 දී රු. බිලියන 282 ක් හා 2019 දී රු. බිලියන 265 ක් ලෙස පැවැති **පුද්ගල වේතන වියදම් කාණ්ඩය 2021 දී රු. බිලියන 290 දක්වා** ඉහළ ගොස් ඇත. |
| 3 | බැරැක්ක සහ නවාතැන් පහසුකම් මෙන්ම සේවයේ නියුතු, ආබාධිත සහ සන්නද්ධ හමුදා සාමාජිකයන් හට සහ මරණයට පත් වූ සන්නද්ධ හමුදා සාමාජිකයන්ගේ බිරින්දෑවරුන් හා දරුවන් වෙත සහනදායී නිවාස ණය ලබා දීම. | 2020 දී රු. මිලියන 7,812 ක් හා 2019 දී රු. මිලියන 7,345 ක් වූ, ගොඩනැගිලි අත්පත් කර ගැනීම සඳහා වෙන් කර තිබූ මුළු මුදල 2021 දී රු. මිලියන 13,582 දක්වා ඉහළ නංවා තිබේ. **මෙම ප්‍රතිපාදන 2021 දී සියයට 74 කින් ඉහළ ගොස් තිබේ**. |

# 3. යටිතල පහසුකම් අංශය

යටිතලපහසුකම් අංශය උප කාණ්ඩ තුනක් යටතේ වර්ගීකරණය කෙරේ: (1) ප්‍රවාහනය, (2) නාගරික සංවර්ධන සහ නිවාස, (3) විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන.

## 3.1 ප්‍රවාහන අංශය

ප්‍රවාහන අමාත්‍යාංශය, අධිවේගී මාර්ග අමාත්‍යාංශය, වරාය හා ගුවන් තොටුපොල අමාත්‍යාංශය සහ අදාළ අමාත්‍යාංශ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ සඳහා වෙන් කළ ප්‍රතිපාදන මෙම අංශය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලට ඇතුළත් වේ.

**ප්‍රවාහන අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන පහත බැස ඇති අතරම මහා මාර්ග හා අධිවේගී මාර්ග වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන ඉහළ යාමක් පෙන්නුම් කරයි**

**3.1.1. ප්‍රදර්ශිතය:** ප්‍රවාහන අංශයේ වියදම් සාරාංශය

***වර්තනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020 -2021 |
| **ප්‍රවාහන අංශය** | **218.7** | **341.0** | **437.2** | **28.2%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *7.39%* | *9.60%* | *11.54%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *1.46%* | *2.13%* | *2.49%* | |
| ප්‍රවාහන අමාත්‍යාංශය | 56.8 (1.9%) | 64.5 (1.8%) | 41.4 (1.1%) | **-35.8%** |
| ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 35.9 (1.2%) | 49.4 (1.4%) | 34.5 (0.9%) | **-30.3%** |


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020 -2021 |
| වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 3.3 (0.1%) | 21.8 (0.6%) | 17.7 (0.5%) | **-18.8%** |
| මෝටර් රථ දෙපාර්තමේන්තුව | 3.3 (0.1%) | 2.7 (0.1%) | 3.3 (0.1%) | **23.4%** |
| අධිවේගී මාර්ග අමාත්‍යාංශය | 156.7 (5.3%) | 245.0 (6.9%) | 330.2 (8.7%) | **34.8%** |
| ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතලපහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 6.2 (0.2%) | 25.1 (0.7%) | **304.3%** |
| වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 1.9 (0.1%) | 1.0 (0.0%) | 1.6 (0.0%) | **62.7%** |
| ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 0.0 (0.0%) | 2.5 (0.1%) | 1.3 (0.0%) | **-50.8%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 20.0 (0.5%) | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ. කි.මී. 100,000 මහා මාර්ග වැඩසටහන සඳහා වෙන් කළ මුදල් ද 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ (රු. බිලියන 20) * ගුවන් සේවා හා අපනයන සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ගුවන් සේවා වෙනුවෙන් මුදල් වෙන් කර නොමැති බැවින් එම අමාත්‍යාංශය මෙම විශ්ලේෂණය සඳහා සැලකිල්ලට ගෙන නොමැත.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## ගත වූ වර්ෂවලදී ප්‍රවාහන වියදම් විශාල වශයෙන් නොවෙනස්ව පැවත තිබේ

**3.1.2. ප්‍රදර්ශිතය:** ප්‍රවාහන අංශය සඳහා වැය කළ මුදල්, රු. බිලියනවලින්, 2015-2019




### විශ්ලේෂණය

2021 වසරේදී මධ්‍යම ආණ්ඩුව සඳහා ප්‍රවාහන අංශය යටතේ වෙන්කර ඇති මුදල රු. බිලියන 437 කි. මෙය රජයේ වියදම්වලින් සියයට 12 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.5 කට සමාන වන්නකි.

2021 අය වැයෙහි කේවල මට්ටමින් වැඩිම ඉහළ යාමක් පෙන්නුම් කරන්නේ ප්‍රවාහන අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ආශ්‍රිතව ය. 2020 සංශෝධිත ඇස්තමේන්තු සමඟ සැසඳීමේ දී 2021 දී ප්‍රවාහන අංශය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය  රු. බිලියන 96 කින් නොහොත් සියයට 28 කින් ඉහළ ගොස් ඇත. 2019 තථ්‍ය වියදම් සමඟ සංසන්දනය කිරීමේදී 2021 සඳහා වෙන් කර ඇති මුදල දෙගුණ වී ඇති අතර එය රු. බිලියන 218 ක ඉහළ යාමකි. රාජ්‍ය අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී වෙන් කරන ලද ප්‍රතිපාදන 2019 දී සියයට 7.4 සිට 2021 දී සියයට 12 දක්වා වැඩි වී ඇත.

වෙන් කරන ලද ප්‍රතිපාදන මෙලෙස ඉහළ යාමට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ අධිවේගී මාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කළ මුදල ඉහළ යාම යි. 2019 දී මේ සඳහා වෙන් කර තිබූ මුදල රු. බිලියන 157 ක් වූ අතර එය 2021 දී රු. බිලියන 330 දක්වා රු. බිලියන 173 කින් ඉහළ ගොස් ඇත. ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතලපහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුදලෙහි රු. බිලියන 19 ක සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබෙන අතර ග්‍රාමීය මාර්ග කි. මී. 100,000 ක් ඉදිකිරීම උදෙසා රු. බිලියන 20 ක වටිනාකමකින් යුතු අයවැය යෝජනාවක් ඉදිරිපත් කර තිබේ.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන් වන පරිදි රජයේ අරමුදල් සම්පාදනය අවශ්‍ය වන මාර්ග සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති සියල්ලම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබේ. කෙසේ වෙතත්, දුම්රිය, බස් රථ, වරාය හා ගුවන් ආදී අරමුදල් වෙන් කර නොමැති ඇතැම් ප්‍රතිපත්ති ද දක්නට ලැබේ. ප්‍රවාහන අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 2.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**3.1.3. ප්‍රදර්ශිතයः** 2021 රාජ්‍ය අයවැයට සාපේක්ෂව රජයේ ප්‍රවාහන ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 1 | ඒකාබද්ධ මාර්ග ජාල | 2020 දී රු. බිලියන 245 ක් හා 2019 දී රු. බිලියන 156.7 ක් ලෙස පැවැති **අධිවේගී මාර්ග අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුදල** 2021 දී රු. බිලියන 330 දක්වා සැලකිය යුතු ලෙස වැඩි කර තිබේ.<br><br>2019 දී **ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතලපහසුකම් අමාත්‍යාංශය සඳහා** කිසිදු මුදලක් වෙන් කර නොතිබුණ ද 2021 දී එය රු. බිලියන 25 දක්වා වැඩි කර තිබේ. |
| 1.1 | මහනුවර සහ නුවරඑළිය සම්බන්ධ කෙරෙන අධිවේගී මාර්ගයකට අදාළ සාධ්‍යතා අධ්‍යයන සිදු කිරීමට නියමිත අතර, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය, වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ උතුරු හා රත්නපුර අධිවේගී මාර්ග ව්‍යාපෘති දීර්ඝ කර අවසන් කෙරෙනු ඇත. | **අධිවේගී මාර්ග සංවර්ධනය උදෙසා 2020 දී වෙන් කර තිබුණු රු. බිලියන 134 මුළු මුදල 2021 දී රු. බිලියන 69 දක්වා අඩු කර තිබේ.** දක්ෂිණ අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම සඳහා කිසිදු මුදලක් වෙන් කර නොතිබීම මීට ප්‍රධානත ම හේතුව යි. 2020 දී මෙම ව්‍යාපෘති දෙක සඳහා රු. බිලියන 92 ක් වෙන් කර තිබුණි.<br><br>2021 වසරේදී පහත දැක්වෙන අනෙකුත් අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා ද මුදල් වෙන් කර තිබේः<br>**1.** කොළඹ සිට මහනුවර දක්වා ඉදිකෙරෙන මධ්‍යම අධිවේගී මාර්ගය රු. බිලියන 35<br>**2.** කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය රු. මිලියන 40<br>**3.** නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මත ඉදි කෙරෙන අධිවේගී මාර්ගයः රු. බිලියන 14<br>**4.** වරාය පිවිසුම් කණු මත ඉදි කෙරෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතියः රු. බිලියන 20 |
| 1.2 | වාහන ඉස්සර කිරීමේ මං තීරු ඇතුළත් කිරීම, මාර්ග කි.මී. 120,000 ක් නවීකරණය කිරීම සහ කි.මී. 100,000 ක විකල්ප මාර්ග පද්ධතියක් ගොඩ නැගීම | **අධිවේගී මාර්ග සංවර්ධනය උදෙසා 2020 දී වෙන් කර තිබුණු රු. බිලියන 81 මුළු මුදල 2021 දී රු. බිලියන 218 දක්වා වැඩි කර තිබේ.** එලෙස වෙන් කරන ලද ප්‍රතිපාදන අතුරෙන් වැඩියෙන්ම ඉහළ ගොස් ඇති ප්‍රතිපාදන පහත දැක්වේः<br>**1.** ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත පිවිසීම සඳහා **කි.මී. 100,000 ක විකල්ප මාර්ග පද්ධතියක් ඉදිකිරීම** - 2020 රු. බිලියන 5 ක් ලෙස වෙන් කර තිබූ මුදල 2021 දී රු. බිලියන 93 දක්වා වැඩි කර ඇත. (රජය අයවැය කතාව මගින් මීට තවත් අමතර රු. බිලියන 20 ක් වෙන් කර ඇත)<br>**2.** මාර්ග ව්‍යාපෘතිය (ශ්‍රී ලං. රජය-ආ.සං.බැංකුව) - 2020 රු. බිලි. 27, 2021 රු. බිලි 42<br>**3.** මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම්වලට අදාළ පරතර පියවීමේ අරමුදල් සම්පාදනය - 2020 දී රු. බිලි. 13 සිට 2021 දී රු. බිලි 31 දක්වා<br><br>පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සඳහා වෙන් කර තිබුණු මුදල 2020 දී රු. බිලියන 13.5 සිට 2021 දී රු. බිලියන 27 දක්වා ඉහළ ගොස් ඇත.<br><br>එපමණක් ද නොව, ග්‍රාමීය මාර්ග හා පාලම් සංවර්ධනය වෙනුවෙන් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතලපහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සඳහා රු. බිලියන 25 ක් වෙන් කර ඇත. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2 | දුම්රිය සහ බස් රථ ප්‍රවාහන සේවා | **ප්‍රවාහන අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුදල** 2020 දී රු. බිලියන 64.5 ක් ද 2019 දී රු. බිලියන 56.8 ක් ද වූ අතර එය 2021 දී රු. බිලියන 41.4 දක්වා අඩු කර තිබේ. |
| 2.1 | කොළඹ-පානදුර-වේයන්ගොඩ, රාගම-කටුනායක-මීගමුව සහ මරදාන-හෝමාගම දුම්රිය මාර්ග විදුලි දුම්රිය මාර්ග බවට හැරවෙනු ඇත. ප්‍රධාන දුම්රිය ස්ථාන සියල්ලම සංවර්ධනය කෙරෙනු ඇති අතර විද්‍යුත්ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත. | ප්‍රතිපත්තියේ සඳහන් කර ඇති දුම්රිය මාර්ගය ඉදිකිරීම සහ සුහුරු ප්‍රවේශපත්‍ර පද්ධතියක් හඳුන්වා දී ම සඳහා කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. බිලියන 3.4 ක් වෙන් කර තිබේ (ශ්‍රී ලංකා රජය/ආ.සං.බැ). ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම වෙනුවෙන් රු. බිලියන 1.9 ක් වෙන් කර ඇත. |
| 2.2 | සියලුම දුම්රිය මැදිරි සහ දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීම. අවශ්‍ය දුම්රිය එන්ජිම් ආනයනය කිරීම සඳහා සහාය ලබා දීම සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය ට්‍රේලර් දේශීයව නිෂ්පාදනය කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | **දුම්රිය, දුම්රිය මාර්ග සහ සංඥා පද්ධති සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන** 2020 දී රු. මිලියන 39,495 ක් සහ 2019 දී රු. මිලියන 25,633 ක් ලෙස පැවති අතර එය 2021 දී රු. මිලියන 24,290 දක්වා අඩු කර තිබේ.<br><br>මගී ප්‍රවාහන දුම්රිය මැදිරි 200 ක් අලුත්වැඩියා කිරීමද ඇතුළුව **දුම්රිය පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 4,060 ක මුදලක් වෙන් කර ඇත.**<br><br>**2021 වසරේදී දුම්රිය එන්ජිම් මිල දී ගැනීම සඳහා කිසිදු මුදලක් වෙන් කර නොමැත.** කෙසේ වෙතත්, 2022 වසරේ සිට ඉදිරියට වාර්ෂිකව දුම්රිය එන්ජිම් 12 ක් ප්‍රසම්පාදනය කරගැනීම උදෙසා රු. බිලියන 3 ක් වැය කිරීමට අපේක්ෂිතව ඇත (ශ්‍රී.ලං.රජය-කැනඩාව). |
| 2.3 | පවතින බස් රථ වෙනුවට නව බස් රථ යොදා වත්මන් බස් තොගය අළුත් කිරීම තුළින් ලංකා ගමනාගමන මණ්ඩලය නවීකරණය කිරීම, 'හරිත ප්‍රවාහන සංකල්පය' යෙදවීම, දුම්රිය සහ බස් මාර්ග සම්බන්ධ කිරීම, පවතින ඇළ මාර්ග ගොඩ නැගීම සහ පෞද්ගලික වාහන නගරාශ්‍රිත රථගාල්වල නවතා පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීමේ (park-and-ride) ක්‍රමයක් හඳුන්වා දීම සහ ඕනෑම බස් රථයක භාවිතා කළ හැකි විද්‍යුත් ප්‍රවේශපත්‍ර පද්ධතියක් හඳුන්වා දීම. | වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය සඳහා **2020 දී රු. බිලියන 19 ක් වෙන් කර තිබූ අතර එය 2021 දී රු. බිලියන 14 දක්වා අඩු කර තිබේ.**<br><br>2020 දී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නව බස් රථ 200ක් මිල දී ගැනීම වෙනුවෙන් රු. බිලියන 6 ක් වෙන් කර තිබේ. 2021 සහ 2022 දී ඉන්දියානු ණය ක්‍රමය ඔස්සේ බස් රථ 500 ක් මිල දී ගැනීම උදෙසා රජය රු. මිලියන 895 ක් සහ රු. මිලියන 2,910 ක් පිළිවෙළින් වෙන් කර ඇත. |
| 3 | වරාය හා ගුවන් සේවා | 2020 දී රු. බිලියන 1.0 ක් ලෙස පැවැති **වරාය හා නාවික අමාත්‍යාංශය සඳහා වෙන් කර තිබුණු මුදල 2021 දී රු. බිලියන 1.6 දක්වා වැඩි කර තිබේ.** එය 2019 දී පැවති රු. බිලියන 1.9 මුදලේ සිට පහත බැස ඇත.<br><br>එමෙන් ම, 2021 දී ගුදම් පහසුකම්, බහාලුම් අංග, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා රු. බිලියන 1.3 ක් වෙන් කර ඇති අතර 2020 දී වෙන් කර තිබුණු රු. බිලියන 2.5 ක මුදල් ප්‍රතිපාදනය මෙහිදී අඩු කර ඇත. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 3.1 | කොළඹ වරාය: බටහිර පර්යන්තය සහ නැගෙනහිර බහාලුම් පයර්න්තය ඉදිකිරීම | බටහිර සහ නැගෙනහිර බහාලුම් පර්යන්ත ඉදිකිරීම වෙනුවෙන් අයවැය මගින් **කිසිදු මුදලක් වෙන් කර නොමැත**. |
| 3.2 | නැගෙනහිර බහාලුම් පර්යන්තය සහ දකුණු ආසියා පිවිසුම් පර්යන්තය අතර හරස් නැංගුරම්පළක් අභිනවයෙන් ඉදිකිරීම සඳහා සාධ්‍යතා අධ්‍යයන සිදු කෙරෙනු ඇත. | කොළඹ උතුර වරාය සම්බන්ධයෙන් සාධ්‍යතා අධ්‍යයනය සිදු කිරීම වෙනුවෙන් **රු. බිලියන 380 ක් වෙන් කර ඇත**. |
| 3.3 | හම්බන්තොට වරාය: හම්බන්තොට නිදහස් වෙළෙඳ කලාපය සඳහා අවශ්‍ය සියුම භෞතික යටිතලපහසුකම් සංවර්ධනය කරන අතර නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ මාර්ග යොමු කිරීම ආදී පොදු සේවා සැපයීම | **මුදල් වෙන් කර නොමැත** |
| 3.4 | ගාල්ල, කන්කසන්තුරේ සහ ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කිරීම | කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. බිලියන 1.1 ක් වෙන් කර ඇත. |
| 3.5 | මත්තල ගුවන්තොටුපළට නව ටැක්සි මාර්ගයක් සහ භාණ්ඩ පර්යන්තයක් එකතු කරන හා අනෙකුත් සියලුම දේශීය ගුවන්තොටුපළවල් හා මගී ප්‍රවාහන පර්යන්ත සංවර්ධනය කරන අතරම පහසුකම් වැඩිදියුණු කරමින් කොළඹ ගුවන්තොටුපළ සඳහා දෙවන ගුවන් යානා ධාවන පථයක් හා මගී පර්යන්තයක් ඉදි කරනු ඇත. | ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘති කිසිවක් සඳහා ජාතික අයවැයෙන් **මුදල් වෙන් කර නොමැත**. |

## නාගරික සංවර්ධනය සහ නිවාස අංශය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මෙන්ම එය යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ යටතේ සිදු කෙරෙන වියදම්,නාගරික සංවර්ධන හා නිවාස උප කාණ්ඩයට අදාළව වෙන් කෙරෙන ප්‍රතිපාදනවලට ඇතුළත්වේ.

**මෙම අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 2021 දී ඉහළ ගොස් ඇතත් එය 2019 දී පැවැති මට්ටම් තරම් ඉහළ නොවේ**

**3.2.1. ප්‍රදර්ශිතය:** නාගරික සංවර්ධනය සහ නිවාස අංශයේ සාරාංශය

***වටිනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **නාගරික සංවර්ධනය සහ නිවාස අංශය** | **62.1** | **51.9** | **59.5** | **14.7%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *2.1%* | *1.5%* | *1.6%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *0.41%* | *0.32%* | *0.34%* | |
| නාගරික සංවර්ධන හ නිවාස අමාත්‍යාංශය* | 58.3<br>(2.0%) | 20.5<br>(0.58%) | 23.5<br>(0.62%) | **14.7%** |

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 0.19 (0.006%) | 0.18 (0.005%) | 0.40 (0.011%) | **127%** |
| නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය** | දත්ත නොමැත | 23.2 (0.65%) | 12.6 (0.33%) | **-45.6%** |
| ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 0.7 (0.02%) | 6.4 (0.18%) | 18.6 (0.49%) | **189.0%** |
| වතු නිවාස හා ප්‍රජා යටිතලපහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය*** | 3.0 (0.10%) | 1.8 (0.05%) | 2.8 (0.07%) | **55.5%** |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 0.46 (0.016%) | 0.45 (0.013%) | 0.59 (0.016%) | **31.6%** |
| රජයේ කර්මාන්තශාලා | 0.28 (0.009%) | 0.27 (0.008%) | 0.24 (0.006%) | **-11.6%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 2.0 (0.053%) | දත්ත නොමැත |

සටහන: * අහෝසි කරන ලද වැය ශීර්ෂයක් වන මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයද 2019 වසර සඳහා නාගරික නිවාස හා සංවර්ධන අමාත්‍යාංශය යටතෙට ඇතුළත් කර ඇත.

** වෙරළ සංරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැහැර කර ඇත.


*** අහෝසි කරන ලද වැය ශීර්ෂයක් වන ප්‍රජා සවිබලගැන්වීම් හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ද 2019 වසර සඳහා වතු නිවාස හා ප්‍රජා යටිතලපහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතට ඇතුළත් කර ඇත.

"නගර සභා සහ මහ නගර සභා බලප්‍රදේශවල ඇවිදින මං තීරු සහ පොදු පහසුකම් සංවර්ධනය කිරීම" සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනද" 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ (රු. බිලියන 2)

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

**ගෙවුණු වසරවල දී මෙම අංශය සඳහා වියදම් කර ඇති  මුදල් ප්‍රමාණය සැලකිය යුතු අන්දමින් වැඩි වී ඇති අතර එය 2020 සහ 2021 කාලවලදී තරමක් අඩු වී ඇත.**

**3.2.2. ප්‍රදර්ශිතය:** නාගරික සංවර්ධනය සහ නිවාස අංශය සඳහා වැය කර ඇති මුදල්, රු. බිලියනවලින්, 2015-2021




### විශ්ලේෂණය

2021 වසරේදී මධ්‍යම ආණ්ඩුව සඳහා නිවාස සංවර්ධන අංශය යටතේ වෙන්කර තිබුණු මුදල රු. බිලියන 59.5 ක් විය. මෙය රජයේ වියදම්වලින් සියයට 1.6 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.34 කට සමාන වන්නකි.

2019 තථ්‍ය වියදම් හා සැසඳීමේදී 2020 සහ 2021 යන වසර දෙකෙහිදීම මෙම අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන පහත බැස ඇත. මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය අහෝසි කිරීම, මූලික වශයෙන්ම ඊට හේතු වී ඇත. කෙසේ වෙතත්, එම අමාත්‍යාංශය යටතේ පැවැති ඇතැම් ව්‍යාපෘති නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත පවරා තිබේ.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන් වන පරිදි නාගරික සංවර්ධන හා නිවාස අංශය යටතේ මුදල් වෙන් කර ඇත්තේ ප්‍රතිපත්ති කිහිපයක් සඳහා පමණි. නාගරික සංවර්ධනය සහ නිවාස අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති සහ ඊට අදාළ අයවැය නිරීක්ෂණ පහත 3.2.3 ප්‍රදර්ශිතයෙහි දැක්වේ.

**3.2.3. ප්‍රදර්ශිතය:** 2021 රාජ්‍ය අයවැයට සාපේක්ෂව රජයේ නාගරික සංවර්ධන හා නිවාස ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **නගර සංවර්ධනය** | |
| 1.1 | කොළඹ වරාය හා කටුනායක ගුවන් තොටුපළ, හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපළ සහ කන්කසන්තුරේ වරාය හා ගුවන් තොටුපළ ඒකාබද්ධ කරමින් ඉංග්‍රීසි 'C' හැඩයේ ආර්ථික කොරිඩෝර නමයක් සංවර්ධනය කෙරෙනු ඇත. | පළාත් නමයෙහි නගර සංවර්ධන ව්‍යාපෘති සඳහා **රු. මිලියන 3,423 ක මුදලක්** වෙන් කොට ඇත. ඒවා ආර්ථික කොරිඩෝරවලට සම්බන්ධ වන්නේද යන්න නිර්ණය කර ගැනීමට හැකියාවක් නොමැත. |
| 1.2 | බහුමාන සිවිමහා වාණිජ නගර (කොළඹ, හම්බන්තොට, යාපනය හා ත්‍රිකුණාමලය) සහ ජාතික, සම්බන්ධක හා පොකුරු නගර සංවර්ධනය. | බහුමාන සිවි මහා වාණිජ නගර සංවර්ධනය කිරීම සඳහා හෝ ආර්ථික කොරිඩෝර ඒකාබද්ධ කිරීම සඳහා හෝ අයවැයෙහි **කිසිදු අමතර නව ව්‍යාපෘතියක් හඳුන්වා දී නොමැත**. එහෙත්, යාපනය උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු. බිලියන 1 ක මුදලක් වෙන් කර තිබේ. |
| 1.3 | ප්‍රධාන ප්‍රදේශවල අහස් පාලම්, සිරස් රථ ගාල් හා ගුවන් පාලම් ඇතුළු කරන අතර ම අථිය හා චක්‍රීය මාර්ග පද්ධතියක් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියක් හරහා නව කොළඹ-වාණිජ හා මූල්‍ය කේන්ද්‍රස්ථානය ගොඩ නැගීම | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය වෙනුවෙන් **මුදල් වෙන් කර නොමැත**. |
| 1.4 | කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ හා ජල පිරිපහදු පද්ධතියක්ද ඇතුළුව කොළඹ අලංකරණය කිරීමේ නව ව්‍යාපෘතිය. | **කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් වෙන් කර ඇත** (2021 දී රු. බිලියන 5.7 ක්) |
| **2** | **නිවාස** | |
| 2.1 | දිගු කාලීන පහසු ගෙවීමේ සැලසුම් මත තරුණ යුවළ වලට නාගරික ප්‍රදේශයකින් නිවසක් මිල දී ගැනීමට ඉඩකඩ සලසනු පිණිස රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ විශේෂ නිවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත. | **මුදල් වෙන් කර නොමැත**. |
| 2.2 | සාධාරණ කුලියක් මත තාවකාලික නවාතැන් ස්ථාන අවශ්‍ය වන පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව යටතේ බහුමහල් නිවාස සංකීර්ණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත. | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව යටතේ බහුමහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා **මුදල් වෙන් කර නොමැත**. |
| 2.3 | අලුත්වැඩියා කිරීමට අසීරු තත්ත්වයේ පවතින තට්ටු නිවාස වෙනුවට දිවයින පුරා ම අභිනව බහු-මහල් නිවාස සංකීර්ණ ඉදි කෙරෙනු ඇත. | නිවාස යෝජනා ක්‍රම අලුත්වැඩියා කිරීම සඳහා **රු. මිලියන 100 ක මුදලක් වෙන් කර ඇත**. |
| 2.4 | අවතැන් වූ ජනතාව සහ පැල්පත්වල ජීවත් වන්නන් වෙනුවෙන් නිවාස යෝජනා ක්‍රම හරහා නිවාස ලබා දීම. | අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම සඳහා **රු. බිලියන 8 ක් වෙන් කර ඇති** අතර එය 2019 වසරේ වෙන් කළ මුදලට ම සමාන වේ. |
| 2.5 | කෘෂිකර්මාන්තය සඳහා පවතින ඉඩම් ආරක්ෂා කරමින් ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශවල සියලු පහසුකම් සහිත නිවාස යෝජනා ක්‍රම ඉදිකෙරෙනු ඇත. | ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශවල නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විශේෂ වශයෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැත. |
| 2.6 | යුද්ධයෙන් පීඩාවට පත් වූ පවුල් සඳහා නිවාස ලබා දෙනු ලැබේ. | උතුරු සහ නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් පීඩාවට පත් වූ පවුල් වෙනුවෙන් සාම්ප්‍රදායික ගඩොල් හා සිමෙන්තියෙන් නිම කළ ස්ථිර නිවාස ලබා දීමේ වැඩසටහන සඳහා වෙන් කළ මුදල **2019 දී රු. බිලියන 1.5 ක් වූ අතර එය 2021 දී රු. බිලියන 5 දක්වා වැඩි කර ඇත**. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2.7 | වතුවලට බාධාවක් ඇති නොකෙරෙන අඩු උස නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දෙනු ඇත. අංග සම්පූර්ණ සෞඛ්‍ය සත්කාර මධ්‍යස්ථාන, පෙර පාසල් සහ ප්‍රජා මධ්‍යස්ථාන ආදී පහසුකම් මෙම නිවාස යෝජනා ක්‍රමවලට ඇතුළත් වනු ඇත. මෙම යෝජනා ක්‍රම මගින් සෑම වතුකර පවුලක් සඳහාම නිවාස ලබා දීම. | 2021 වසරට අදාළව **වතු නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා රු. බිලියන 1 ක් ද** ඉන්දීය රජයේ ප්‍රදානයන්ගෙන් සහාය ලබන නිවාස වැඩසටහන් සඳහා **රු. බිලියන 0.5 ක් ද වෙන් කර තිබේ.** |

## විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන අංශය

බලශක්ති අමාත්‍යාංශය, විදුලිබල අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය සහ එකී අමාත්‍යාංශයන් යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශයන් යටතේ සිදු කෙරෙන වියදම් විදුලිබල, බලශක්ති සහ ජල සම්පාදන අංශය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන වලට ඇතුළත්වේ.

### ජල සම්පාදනය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වැඩි කර ඇති නමුත් විදුලිබල අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුදල් කපා හැරීමකට ලක් කර තිබේ.

**3.3.1. ප්‍රදර්ශිතය:** විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන අංශයේ සාරාංශය

***අගයයන් රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන අංශය** | **50.0** | **137.7** | **107.5** | **-22.0%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *1.70%* | *3.88%* | *2.84%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *0.33%* | *0.92%* | *0.72%* | |
| බලශක්ති අමාත්‍යාංශය | 0.0 (0.01%) | 0.2 (0.00%) | 0.3 (0.01%) | **52.3%** |
| විදුලිබල අමාත්‍යාංශය | 0.8 (0.03%) | 58.3 (1.64%) | 0.3 (0.01%) | **-99.5%** |
| සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 0.0 (0.00%) | 0.7 (0.02%) | 0.7 (0.02%) | **-1.0%** |
| ජල සම්පාදන අමාත්‍යාංශය | 48.8 (1.65%) | 75.8 (2.13%) | 96.1 (2.54%) | **26.8%** |
| ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 0.4 (0.02%) | 2.8 (0.09%) | 4.3 (0.15%) | **56.3%** |


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 0.4 (0.02%) | 1.5 (0.05%) | 2.9 (0.10%) | **93.8%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 5.8 (0.15%) | දත්ත නොමැත |

සටහන: * ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ.''සැමට ජලය'' වැඩසටහන සඳහා (රු. බිලියන 5) සහ සූර්ය බලශක්ති හා ග්‍රාමීය විදුලිබල ජනන යෝජනා ක්‍රම සඳහා (රු. මිලියන 750) වෙන් කර ඇති ප්‍රතිපාදනද 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## ගෙවුණු වසරවලදී මුදල් වෙන් කර ඇත්තේ අඩුවෙන් වුවද 2018 වසරින් පසුව වෙන් කළ මුදල් ප්‍රමාණය ඉහළ ගොස් ඇත.

**3.3.2. ප්‍රදර්ශිතය:** විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන අංශය සඳහා වැය කර ඇති මුදල්, රු. බිලියනවලින්, 2015-2019




### විශ්ලේෂණය

2021 වසරේදී මධ්‍යම ආණ්ඩුව සඳහා විදුලි බල, බලශක්ති සහ ජල සම්පාදන අංශය යටතේ වෙන්කර තිබුණු මුදල රු. බිලියන 107.5 ක් විය. මෙය රජයේ වියදම්වලින් සියයට 2.84 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.72 කට සමාන වන්නකි.

2021 වසරේදී මෙම අංශය සඳහා වෙන් කර ඇති සමස්ථ මුදල් ප්‍රමාණය 2020 සංශෝධිත ඇස්තමේන්තු සමග සැසඳීමේ දී සියයට 22 කින් පහළ බැස තිබේ. මීට බලපා ඇති ප්‍රධානතම හේතුව වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට තිබුණු ණයක් පියවීම හේතුවෙන් 2020 දී බලශක්ති අමාත්‍යාංශයට අදාළ වියදම් ඉහළ ගොස් තිබීමයි. කෙසේ

වෙතත්, 2019 වසරට පෙර කාලය සමග සැසඳීමේදී මෙම අංශය සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

විදුලිබල, බලශක්ති සහ ජල සම්පාදන අංශයට අදාළව 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන් බොහොමයක් රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අයවැය හරහා සැලකිල්ලට භාජනය වී නොමැත. විදුලිබල, බලශක්ති සහ ජල සම්පාදන අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 3.3.3 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**3.3.3. ප්‍රදර්ශිතය:** 2021 වසර සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය සමග සැසඳීමේදී විදුලිබල, බලශක්ති සහ ජල සම්පාදන ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **බලශක්ති** | 2020 දී රු. මිලියන 166 ක් ලෙස පැවති බලශක්ති අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුළු මුදල 2021 දී රු. මිලියන 253 දක්වා සියයට 52 කින් වැඩි වී තිබේ. මෙලෙස විශාල ලෙස එම මුදල වැඩි වීමට ප්‍රධාන හේතුව වන්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය ඉහළ යාමයි. |
| 1.1 | භූ විද්‍යා සමීක්ෂණ කලාප තුනේ හඳුනා ගත් ස්වභාවික ගෑස් ගවේශනය වේගවත් කිරීම. | **මුදල් වෙන් කර නොමැත.** |
| 1.2 | කොලොන්නාව තෙල් පිරිපහදුව නවීකරණය කිරීම ත්‍රිකුණාමලයේ පිහිටි තෙල් ගබඩා ටැංකි නැවත ඉදිකිරීම | **මුදල් වෙන්කර නොමැත.** |
| **2** | **බලශක්ති** | බලශක්ති අමාත්‍යාංශය උදෙසා 2020 දී වෙන් කර තිබුණු රු. බිලියන 58 මුළු මුදල 2021 දී රු. බිලියන 313 දක්වා වැඩි කර තිබේ. මීට ප්‍රධාන හේතුව වන්නේ 2020 වසරේදී රු. බිලියන 58 ක වටිනාකමින් යුතු විදේශ ණයක් පියවීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවීම සඳහා මුදල් වියදම් කිරීමට සිදු වීමයි. |
| 2.1 | ඉදිරි වසර තුළදී කොළඹ ප්‍රදේශයේ පිහිටි ඉන්ධන බලයෙන් ක්‍රියාත්මක වන බලාගාර ස්වභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම. | **මුදල් වෙන් කර නොමැත.** |
| 2.2 | විදුලිය බෙදාහැරීමේ සුහුරු ජාලයක් ගොඩනගා 2020 වන විට බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය ද, 2021 වන විට උමා ඔය ජල විදුලි බලාගාරය ද, 2023 වන විට මොරගොල්ල ජල විදුලි බලාගාරය ද, 2024 වන විට තලපිටිගල හා සීතාවක ජල විදුලි බලාගාර ද සම්පූර්ණ කිරීම තුළින් මෙගාවොට් 230 ක ධාරිතාවක් එක් කිරීම. | **මුදල් වෙන් කර නොමැත.** |
| 2.3 | 2021 වන විට මන්නාරම සුළං බලාගාරය වෙත මෙගාවොට් 100 ක බලශක්ති ධාරිතාවක් එකතු කිරීම. සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් මුළු දිවයින ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර, කාර්මික අපද්‍රව්‍ය යොදා බලශක්ති උත්පාදනය කිරීමේ වැඩසටහනක් හඳුන්වා දෙනු ඇත. | **මුදල් වෙන් කර නොමැත.** |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2.4 | අඩු/සහනදායී පොලී අනුපාත යටතේ බැංකු ණය හරහා ගොඩනැගිලි මත සවි කරන සූර්යබල පද්ධති ස්ථාපනය කිරීම දිරිමත් කිරීමට නියමිත අතර, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිගැන්වනු ලැබේ. | අඩු ආදායම්ලාභී පවුල් සඳහා ගොඩනැගිලි මත සවි කළ හැකි සූර්යබල පද්ධති ලබා දීමට ද අයවැය කතාව මගින් යෝජිත ය. එපමණක් ද නොව, සියලුම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා වසර 7 ක බදු සහන කාලයක් හඳුන්වා දීමේ යෝජනාවක් ද අයවැය කතාවට ඇතුළත් වේ. |
| **3** | **ජල සම්පාදනය** | 2020 දී රු. බිලියන 76 ක් ලෙස පැවති **ජල සම්පාදන අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුළු මුදල 2021 දී රු. බිලියන 96 දක්වා සියයට 27 කින්** වැඩි කර තිබේ. |
| 3.1 | ශ්‍රී ලංකා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදු කරමින් පවතින ව්‍යාපෘති සහ ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති පුළුල් කෙරෙනු ඇත. | අයවැය ඇස්තමේන්තු මගින් පළමු වතාවට රු. බිලියන 25 ක් වෙන් කරමින් 'සැමට ජලය' වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජිත ය. එම වැඩසටහන සඳහාම අමතර රු. බිලියන 5 ක් අයවැය කතාව මගින් වෙන් කර ඇත. |
| 3.2 | කෘෂිකාර්මික සම්පත් කාර්යක්ෂම ලෙස යොදා ගැනීම වෙනුවෙන් ක්‍රමවේද යොදා ගැනීම සඳහා අඩු පොලී ණය සහ බදු සහන ලබා දෙනු ඇත. | සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප ස්ථාපනය කරනු පිණිස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් 10,000 ක් වෙත රු. 150,000 ක වටිනාකමින් යුතු ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීමේ යෝජනාවක් ද අයවැය කතාවෙහි සඳහන් වේ. කෙසේ වෙතත්, අයවැය කතාවෙහි ඇමිණුම හෝ අයවැය ඇස්තමේන්තුවල මෙම යෝජනාව සඳහා මුදල් වෙන් කර නොමැත. |
| 3.3 | කෘමිනාශක සහ අනෙකුත් රසායනික ද්‍රව්‍ය ජලයෙන් ඉවත් කොට භූගත ජලය කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ජලය ගබඩා කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම. | **මුදල් වෙන් කර නොමැත.** |
| 3.4 | ගංවතුර වළක්වා ගැනීමේ සහ පූර්ව අනතුරු හැඟවීමේ පද්ධති හා ජලය ගබඩා කිරීමේ සහ පොම්ප කිරීමේ ක්‍රමවේද සහිතව ගංවතුර පාලන යාන්ත්‍රණයක් සකස් කිරීම. | **මුදල් වෙන් කර නොමැත.** |

# 4. වෙළෙඳ හා කර්මාන්ත අංශය

කර්මාන්ත අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය සහ අදාළ අමාත්‍යාංශ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ හා වෙනත් අමාත්‍යාංශ යටතේ ඇති වෙළෙඳ හා කර්මාන්ත අංශයට සම්බන්ධ විශේෂිත දෙපාර්තමේන්තු යටතේ සිදු කෙරෙන වියදම් මෙම අංශය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලට ඇතුළත් වේ.

**2021 දී වෙළෙඳ හා ආයෝජන අංශය වෙත වෙන් කරන ලද මුදල් ප්‍රමාණය රු. බිලියන 5 කින් ඉහළ ගොස් ඇත.**

**4.1 ප්‍රදර්ශිතය:** වෙළෙඳ හා කර්මාන්ත අංශයේ වියදම් සාරාංශය

***වටිනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **වෙළෙඳ හා කර්මාන්ත අංශය** | **7.2** | **12.2** | **17.0** | **39.8%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *0.24%* | *0.34%* | *0.45%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *0.05%* | *0.08%* | *0.10%* | |
| කර්මාන්ත අමාත්‍යාංශය* | 4.9<br>(0.16%) | 3.5<br>(0.10%) | 3.6<br>(0.09%) | **1.4%** |
| බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය | 0.1 | 0.5<br>(0.01%) | 1.1<br>(0.03%) | **146.3%** |
| පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 0.12 | 0.21<br>(0.006%) | 0.17<br>(0.005%) | **-15.8%** |

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 0.8<br>(0.02%) | 1.2<br>(0.03%) | **61.2%** |
| මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 0.1<br>(0.004%) | 0.3<br>(0.008%) | **127.0%** |
| වෙළෙඳ අමාත්‍යාංශය* | දත්ත නොමැත | 4.5<br>(0.13%) | 5.6<br>(0.15%) | **23.2%** |
| මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | 0.13 | 0.15<br>(0.00%) | 0.18<br>(0.00%) | **19.2%** |
| ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 0.04 | 0.05<br>(0.00%) | 0.06<br>(0.00%) | **24.8%** |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 0.37 | 0.88<br>(0.025%) | 0.57<br>(0.015%) | **-35.0%** |
| සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය | 0.1 | 0.7<br>(0.02%) | 1.0<br>(0.03%) | **48.0%** |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්) | 0.10 | 0.09<br>(0.002%) | 0.19<br>(0.005%) | **120.3%** |
| සමුපකාර සේවක කොමිෂන් සභාව | 0.018 | 0.019<br>(0.00%) | 0.024<br>(0.00%) | **26.8%** |
| සංචාරක අමාත්‍යාංශය* | 0.2 | 0.2<br>(0.01%) | 0.5<br>(0.01%) | **139.5%** |
| වෙනත් | 1.9 | 1.9<br>0.05% | 3.7<br>0.10% | **96.5%** |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 0.07 | 0.08<br>(0.00%) | 0.10<br>(0.00%) | **21.6%** |


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 0.07 | 0.07 (0.00%) | 0.08 (0.00%) | **14.6%** |
| වාණිජ දෙපාර්තමේන්තුව | 0.15 | 0.14 (0.00%) | 0.16 (0.00%) | **10.8%** |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 1.07 (0.04%) | 1.37 (0.04%) | 1.49 (0.04%) | **8.1%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | | දත්ත නොමැත |

සටහන: * නැවත පියවීම් සහ වෙළෙඳ හා කර්මාන්ත අංශයට අදාළ නොවන අනෙකුත් ක්ෂේත්‍ර සඳහා මුදල් වෙන් කිරීම නවතා දැමීම සඳහා 2019 වසරේදී කර්මාන්ත අමාත්‍යාංශයේ වෙනස් කිරීම් සිදු කරනලදී. දකුණේ සංවර්ධනය සඳහා වෙන්කර තිබූ මුදල් ඉවත් කිරීම සඳහා 2020 හා 2021 කාලයේදී වෙළෙඳ අමාත්‍යාංශයේ වෙනසක් සිදු කරන ලදී. ජාතික උද්භිද උද්‍යාන සහ වෙළෙඳ හා කර්මාන්ත අංශයට අදාළ නොවන අනෙකුත් ක්ෂේත්‍ර ඉවත් කිරීම සඳහා 2019-21 කාලයේදී සංචාරක අමාත්‍යාංශය තුළ වෙනස්කම් සිදු කරන ලදි.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021)*

## වෙළෙඳ හා කර්මාන්ත අංශය තුළ ප්‍රාග්ධන වියදම් වැය කිරීම සිදු වන්නේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලට වඩා බෙහෙවින් අඩු වශයෙනි.

**4.2 ප්‍රදර්ශිතය:** වෙළෙඳ හා කර්මාන්ත අංශය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය, රු. බිලියනවලින්, 2015-2019



## වෙළෙඳ හා කර්මාන්ත අංශය සඳහා වෙන් කළ මුදල් ගත වූ වර්ෂ තුළ සියයට 50 කින් ම පමණ අඩුවෙන් වියදම් කර තිබේ

**4.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව තථ්‍ය වියදම්වල) |
|---|---|---|
| **වෙළෙඳ හා කර්මාන්ත අංශය** | **11.1%** | **45.8%** |
| වාණිජ දෙපාර්තමේන්තුව | 7.9% | 5.0% |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 8.8% | 2.2% |
| මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | -16.3% | 17.3% |
| ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 9.5% | 0.0% |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 46.4% | 17.0% |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්) | 7.3% | 8.0% |
| සමූපකාර සේවක කොමිෂන් සභාව | 6.5% | 5.6% |
| පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 12.1% | 9.6% |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 4.2% | 6.4% |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2.6% | 11.1% |

### විශ්ලේෂණය

2021 වසරේදී මධ්‍යම ආණ්ඩුව සඳහා වෙළෙඳ හා කර්මාන්ත අංශය යටතේ වෙන්කර ඇති මුදල රු. බිලියන 17 කි. මෙය රජයේ වියදම්වලින් සියයට 0.47 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.1 කට සමාන වන්නකි.

2021 වසරේදී මෙම අංශය වෙනුවෙන් වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදන 2020 සංශෝධිත ඇස්තමේන්තු සමග සැසඳීමේ දී සියයට 40 කින් ඉහළ ගොස් තිබේ. 2020 වසරේදී රාජ්‍ය අමාත්‍යාංශ කිහිපයක්ම අලුතින් බිහි කිරීම සහ වෙළඳ අමාත්‍යාංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල සැලකිය යුතු ඉහළ යාමක් සිදු වීම මීට ප්‍රධානතම හේතුව වී ඇත. 2018 සහ 2019 දී වියදම පහත බැසීමක් සිදු වුවද, මින් පෙර මෙම අංශය සියයට 11.1 ක වාර්ෂික සාමාන්‍යය වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

ගත වූ වසරවලදී මෙම අංශය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැති අතර වියදම් හිඟයේ වාර්ෂික සාමාන්‍යය සියයට 45.8 ක් ලෙස වාර්තා වී ඇත.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්ති බොහොමයක් සඳහා මුදල් වෙන් කොට ඇති බව හා එම ප්‍රතිපත්ති බදුවලින් නිදහස් කර ඇති බව පෙනී යයි. වෙළෙඳ හා කර්මාන්ත අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 4.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**4.4 ප්‍රදර්ශිතය:** 2021 වසර සඳහා වෙන් කර ඇති මුදල් සමග සැසඳීමේදී වෙළෙඳ හා කර්මාන්ත ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **අපනයන ප්‍රවර්ධනය** | **විදේශ වෙළෙඳාම් සංවර්ධන වැඩසටහන උදෙසා** 2020 දී **වෙන් කර තිබුණු** රු. බිලියන 610 මුළු **මුදල** 2021 දී රු. බිලියන 1,010 දක්වා **වැඩි කර තිබේ.** |
| 1.1 | පළාත් සියල්ලම ආවරණය කරමින් කාර්මික නගර/නිදහස් වෙළෙඳ කලාප,නිදහස් වරායයන් පිහිටුවීම | කාර්මික කලාප සංවර්ධනය කිරීමේ වැය ශීර්ෂය යටතේ රු. මිලියන 1,900 ක මුදලක් වෙන් කර ඇත. |
| 1.2 | අපනයන ආනයන ක්‍රියාවලීන්ට සහාය දැක්වීම සහ කාලය අපතේ යාම වැළැක්වීම සඳහා තනි හා ඒකීය යාන්ත්‍රික ක්‍රියාවලියක් පිහිටුවනු ලැබේ. | **මුදල් වෙන් කර නොමැත** |
| **2** | **මැණික් හා ස්වර්ණාභරණ**<br><br>ස්වර්ණාභරණ කර්මාන්තයේදී යොදා ගැනෙන නවීන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කෙරෙනු ඇත. | නවීන තාක්ෂණය සහිත යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම සඳහා එම යන්ත්‍රෝපකරණ බදුවලින් **නිදහස් කිරීමට අයවැය කතාව මගින් යෝජනා කෙරී ඇත.** |
| **3** | **සංචාරක කර්මාන්තය** | **සංචාරක කර්මාන්තය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන** 2021 දී 140% **කින් ඉහළ ගොස් ඇත.**<br><br>මීට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මන්නාරමේ මඩු නගරයේ නවාතැන් ඉදිකිරීම සඳහා රු. මිලියන 266 ක අමතර මුදලක් වෙන් කිරීමයි. |
| 3.1 | කොළඹ සහ හම්බන්තොට ගුවන් තොටුපොළ ආශ්‍රිත ආගමන හා විගමන කටයුතු වඩා කාර්යක්ෂම කෙරෙනු ඇති අතර දේශීය ගුවන් ගමන් සඳහා පර්යන්ත දෙකක් නිර්මාණය කිරීමටත් අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් නවීකරණය කිරීමටත් පියවර ගැනෙනු ඇත. | ගුවන් සේවා හා අපනයන සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ගුවන් තොටුපොළවල් නවීකරණය කිරීම සඳහා **කිසිදු මුදල් ප්‍රතිපාදනයක් වෙන් කර නොමැත.** |
| 3.2 | මාර්ග හන්දි ආශ්‍රිතව සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම, සංචාරකයන් සඳහා නවාතැන් පහසුකම් සපයන ස්ථාන ආශ්‍රිතව නවාතැන් වෙන් කර ගැනීමේ තනි මෘදුකාංගයක් සහ විද්‍යුත් ගේට්ටු පද්ධති ස්ථාපනය කිරීම සහ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු සංචාරක හෝටල් සඳහා දිරි දීම. | **මුදල් වෙන් කර නොමැත.** |
| 3.3 | සංචාරක කර්මාන්තය ආශ්‍රිත නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ සංචාරක කර්මාන්තයේ නියැළී සිටින සේවක සංඛ්‍යාව මිලියන 1 දක්වා වැඩි කිරීම. | **නිපුණතා සංවර්ධන පාඨමාලා වෙනුවෙන් රු. මිලියන 45 ක් වෙන් කර ඇත.** |
| 3.4 | ගෘහආශ්‍රිත හා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා විශේෂ වැඩසටහන් බිහි කෙරෙනු ඇත. | **ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය වෙනුවෙන් රු. මිලියන 10 ක් වෙන් කර ඇත.** |
| **4** | **ඇඟළුම් කර්මාන්තය** | බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ආශ්‍රිත සියයට 61 ක ඉහළ යාමක් දක්නට ලැබේ. |
| 4.1 | එරාවූර් ප්‍රදේශයේ කොමිසමට අයත් ඉඩම් අක්කර 200 ක් ආයෝජන මණ්ඩලය විසින් සැලසුම් කර ඇති පරිදි සහ සාධාරණීකරණය කළ නොහැකි බදුවලට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සිදු කර ඇති සංශෝධනවලට අනුව ඇඟළුම් කර්මාන්ත නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වෙන් කිරීම. | අමුද්‍රව්‍ය ආනයනය කිරීම වෙනුවෙන් **නව තීරු බදු ක්‍රමයක් යෝජනා වී ඇත.** කෙසේ වෙතත්, බදු ක්‍රමය පිළිබඳ අතිරේක විස්තර කිසිවක් ලබා දී නොමැත. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 4.2 | විවිධ ඉහළ තාක්ෂණික නිෂ්පාදන සිදු කිරීම සඳහා මහා පරිමාණ ව්‍යාපාර වෙත පහසුකම් සැලසෙනු ඇත. | මහා පරිමාණ ආයෝජන සහ නවීන යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම උදෙසා අයවැය කතාව මගින් එම ආයෝජන සහ යන්ත්‍රෝපකරණ **බදු කිහිපයකින්ම නිදහස් කරඇත**. |

**4.5 ප්‍රදර්ශිතය:** වෙළෙඳ හා කර්මාන්ත අංශයට අදාළව බදු අයකිරීමේ වෙනස්කම්

| ප්‍රතිපත්ති | බදු අයකිරීම්වලට අදාළ වෙනස්කම් |
|---|---|
| සාමාන්‍ය | අපනයන කර්මාන්ත, කිරි නිෂ්පාදන, රෙදිපිළි, සංචාරක කර්මාන්තය, කෘෂි නිෂ්පාදනය, සැකසුම් සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවල ආර්ථික පසුතලය වෙනස් කිරීමේ හැකියාවක් සහිත ඇ.ඩො. මිලියන 10 ඉක්මවන ආයෝජන සඳහා උපායමාර්ගික සංවර්ධන නීතිය යටතේ උපරිම වසර 10 ක සහන ලබා දෙනු ඇත. |
| සාමාන්‍ය | නවීන තාක්ෂණය සහිත යන්ත්‍රෝපකරණ ආනයන බදුවලින් නිදහස් කිරීම |
| සාමාන්‍ය | ආනයන සහ දේශීය නිෂ්පාදන අපනයනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය සුරක්ෂිතභාවය ලබා දෙනු පිණිස සෙස් බද්ද අය කිරීම. |
| සාමාන්‍ය | අපනයන කටයුතු කාර්යක්ෂම කිරීම සහ අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය කර්මාන්ත දිරිමත් කිරීම උදෙසා රට තුළින් සපයා ගත නොහැකි අමුද්‍රව්‍ය හා නවීන තාක්ෂණික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම මත අය කෙරෙන බදු ඉවත් කිරීම. |
| අපනයන ප්‍රවර්ධනය | තොරතුරු තාක්ෂණය සහ ඊට ඇති ප්‍රවේශය ඉහළ නැංවීමේ සේවා ආශ්‍රිත ව්‍යාපාරවල නිරත වන දේශීය සහ විදේශීය මූලාශ්‍ර දෙවර්ගයෙන්ම ලැබෙන ආදායම් සහ මෙරට වාසය කරන්නන් ලෙස හෝ නොකරන්නන් ලෙස හෝ ඔවුන් උපයා ගන්නා ආදායම්ද ආදායම් බදුවලින් නිදහස් කෙරෙනු ඇත. |
| අපනයන ප්‍රවර්ධනය | කොළඹ සහ හම්බන්තොට වරායයන් ජාත්‍යන්තර වෙළෙඳාම ආශ්‍රිත වෙළෙඳ භාණ්ඩ අලෙවි කේන්ද්‍ර ලෙස ප්‍රවර්ධනය කිරීම සහ බැඳිගුදම් හා ගුදම් හා සබැඳි අක්වෙරළ ව්‍යාපාර ආශ්‍රිත ආයෝජන දිරිමත් කිරීම උදෙසා එවැනි ආයෝජන සියලු බදුවලින් නිදහස් කිරීමට යෝජනා වී ඇත. |
| අපනයන ප්‍රවර්ධනය | ශීත කාමර පහසුකම්වලට අදාළව රේගු බදු සහන ලබා දීම. |
| අපනයන ප්‍රවර්ධනය | නව නිෂ්පාදන අංශ සඳහා අවශ්‍ය වන රථ වාහන අමතර කොටස් මත අයකෙරෙන ආනයන අයබදු අඩු කර ඇත. |
| අපනයන ප්‍රවර්ධනය | ඛනිජ වැලි, ෆොස්ෆේට්, පොහොර සහ මිනිරන් ආදී පූර්ණ ලෙස වර්ධනය නොවූ කර්මාන්ත ඉහළ වටිනාකමක් සහිත අපනයන කර්මාන්ත ලෙස සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් වූ වියදම් අඩු කිරීමේ අරමුණින් නැනෝතාක්ෂණ ආයතනය සමග කටයුතු කරන දේශීය ව්‍යවසායකයන් බදුවලින් නිදහස් කිරීමට යෝජනා වී ඇත. |
| ඇඟළුම් | බතික් සහ ඒ හා සබැඳි ඇඟළුම් ජාතික කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම උදෙසා ජාතික උප ශීර්ෂ යටතේ බතික් නිෂ්පාදන ආනයනය තහනම් කිරීම. |
| ඇඟළුම් | විදේශිකයන් සහ සංචාරකයන් අතර ඉල්ලුමක් පවතින ඉහළ තත්ත්වයේ ඇඟළුම් හා සම් නිෂ්පාදන සිදු කෙරෙන දේශීය හා ජාත්‍යන්තර ඇඟළුම් නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් වශයෙන් දේශීය ඇඟළුම් කර්මාන්තය දියුණු කිරීම උදෙසා ආනයන සීමා ලිහිල් කිරීම සහ නව තීරුබදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. |
| සංචාරක කර්මාන්තය | පළාත් පාලන ආයතන විසින් අය කරනු ලැබෙන බදු සහ අය ගාස්තු, ඉහළ සීමාවක් සහිතව සරල කිරීම. |

# 5. පරිසර අංශය

පරිසර අමාත්‍යාංශය, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, වනජීවී රැකවරණය අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ආදිය පරිසර අංශය සඳහා වෙන් කරන ප්‍රතිපාදනවලට අයත් වේ. මීට අමතරව, වෙරළ සංරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අදාළ වියදම්ද ඊට ඇතුළත් වේ.[1]

## පරිසර අංශය සඳහා වෙන් කර ඇති මුදල් අයවැය කතාවෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 දී දෙගුණ වී ඇත.

**5.1 ප්‍රදර්ශිතය:** පරිසර අංශයේ වියදම් සාරාංශය

***වර්තනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 **තථ්‍ය** | 2020 **සංශෝධිත** | 2021 **අයවැය** | 2020-2021 |
| **පරිසර අංශය** | **9.14** | **8.94** | **18.30** | **105%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *0.31%* | *0.25%* | *0.48%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *0.06%* | *0.06%* | *0.10%* | |
| පරිසර අමාත්‍යාංශය | 2.49 | 1.28 | 2.00 | **55.8%** |
| | 0.1% | 0.0% | 0.1% | |
| වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය | දත්ත නොමැත | 1.46 | 1.24 | **-15.1%** |
| | | 0.04% | 0.03% | |

1 නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට වෙරළ සංරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව උපග්‍රහණය කර තිබේ. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පවතින්නේ සංචාරක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ය.


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| වනජීවී රැකවරණය අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 4.86<br>0.16% | 4.80<br>0.14% | 6.11<br>0.17% | **27.4%** |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2.24<br>0.08% | 2.08<br>0.06% | 2.54<br>0.07% | **22.3%** |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1.70<br>0.06% | 1.77<br>0.05% | 2.16<br>0.06% | **21.9%** |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 0.92<br>0.03% | 0.91<br>0.03% | 1.29<br>0.04% | **41.5%** |
| වෙනත් | 1.79<br>0.06% | 1.4<br>0.04% | 2.26<br>0.06% | **60.7%** |
| වෙරළ සංරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | 0.63<br>0.02% | 0.72<br>0.02% | 1.14<br>0.03% | **58.0%** |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 0.89<br>0.03% | 0.68<br>0.02% | 1.12<br>0.03% | **63.4%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 6.7<br>0.18% | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ. සුරකිමු ගංගා ව්‍යාපෘතිය (රු.මිලියන 200),වන සංරක්ෂණය (රු.මිලියන 3,500) සහ අලි මිනිස් ගැටුම වැළැක්වීමේ ක්‍රියාදාම (රු.මිලියන 3,000) ආදිය වෙනුවෙන් වෙන් කර ඇති මුදල්ද 2021 අයවැය යෝජනාවලට ඇතුළත් කර ඇත

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## පරිසර අංශය සඳහා ගතවූ වසරවල වෙන් කර තිබූ ප්‍රාග්ධන වියදම් පූර්ණ වශයෙන් වැය කර නොමැත

**5.2 ප්‍රදර්ශිතය:** පරිසර අංශය සඳහා වැය කර ඇති මුදල් , රු. බිලියනවලින්, 2015-2019




## ඇතැම් දෙපාර්තමේන්තු යටතේ වැය කර ඇති මුදල් ආශ්‍රිත සැලකිය යුතු අඩුවක් සමගින් වියදම් වර්ධනය අඩු වීම

**5.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව තථ්‍ය වියදම්වල) |
|---|---|---|
| **පරිසර අංශය** | **2.9%** | **19.5%** |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2.5% | 2.3% |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2.9% | 9.1% |
| ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 2.6% | 15.0% |
| වෙරළ සංරක්ෂක හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (තථ්‍ය) | -19.3% | 32.4% |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (තථ්‍ය) | 7.2% | 2.9% |
| අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති අනෙකුත් ප්‍රතිපාදන | 7.4% | 39.6% |

## විශ්ලේෂණය

2021 වසරේ පරිසර අංශය වෙනුවෙන් වෙන් කර ඇති මුදල රු. බිලියන 18.3 කි. මෙය රජයේ වියදම්වලින් සියයට 0.48 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.1 කට සමාන වන්නකි.

2020 සංශෝධිත ඇස්තමේන්තුවලට සාපේක්ෂව බැලීමේදී 2021 වසරේදී පරිසර අංශය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන දෙගුණ වී ඇත. මීට මූලිකම හේතුව වී ඇත්තේ වන සංරක්ෂණයට අදාළව සහ අලි මිනිස් ගැටුම වැළැක්වීමේ ක්‍රියාමාර්ග වෙනුවෙන් 2021 අයවැය කතාව තුළ හඳුන්වා දී ඇති යෝජනා වේ. 5.1 ප්‍රදර්ශිතය මගින් විශ්ලේෂණය කරන ලද අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සියල්ලම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ඉහළ ගොස් ඇති අතර එය එසේ නොවන්නේ වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් පමණි.

මීට අමතරව, තථ්‍ය වියදම් සහ වෙන් කරන ලද මුදල් ප්‍රමාණ අතර 19.5% ක හිඟ සාමාන්‍යයක් සහිතව මෙම අංශය තුළ ගතවූ වසරවලදී පූර්ණ වශයෙන් මුදල් වියදම් කර නොමැති බව පෙනී යයි.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පරිසර අංශය යටතේ සඳහන් ප්‍රතිපත්ති සියල්ලම පාහේ සඳහා මුදල් වෙන් කොට ඇති බව පෙනී යයි. පරිසර අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 5.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**5.4 ප්‍රදර්ශිතය:** 2021 වසර සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සමඟ සැසඳීමේදී පරිසර ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **අපද්‍රව්‍ය බැහැර කිරීම** | |
| 1.1 | ප්‍රජාවන්හි දැනුම්වත්භාවය සහ සක්‍රීය දායකත්වය ඉහළ නැංවීම උදෙසා ඉලක්කගත වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කෙරෙනු ඇත. | පාරිසරික අධ්‍යාපන වැඩසහන් මාලාවක්ම වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය රු. මිලියන 131 ක මුදලක් වෙන් කර ඇත. 2021 දී වැඩි කරන තුරු මෙකී වැඩසටහන් බොහොමයක් සඳහා 2020 දී අඩු මුදල් ප්‍රමාණයක් වැය කර තිබේ. |
| 1.2 | රෝහල් සහ කාර්මික (රසායනික) අපද්‍රව්‍ය බැහැර කිරීම උදෙසා නිසි අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රම සහ නූතන තාක්ෂණයන් මෙන්ම වැඩිදියුණු කරන ලද අපද්‍රව්‍ය උදුන් හඳුන්වා දෙනු ඇත. | රෝහල් සහ කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් කිසිදු විශේෂිත තොරතුරක් **2021 අයවැය ඇස්තමේන්තුවලින් නොසැපයේ**. |
| **2** | **වනාන්තර** | |
| 2.1 | තිරසාර කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය හා වතු කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීම සහ මුඩු/අත්හැර දමන ලද ඉඩම් කෘෂි හා වනාන්තර ඉඩම් බවට පරිවර්තනය කිරීම උදෙසා විද්‍යාත්මක ක්‍රමවේද හඳුන්වා දීම. | අත්හැර දමන ලද මුඩු බිම්වල වන වගාවන් පිහිටුවීම වෙනුවෙන් **වනජීවී රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු. මිලියන 5 ක් වෙන් කර ඇත**. |
| 2.2 | නාගරික වනාන්තර, හරිත පථ, හරිත වහල සහ කෘෂිවනාන්තර පද්ධති පිහිටුවීම සඳහා කාර්මික ආයතන දිරිමත් කෙරෙනු ඇති අතර, ෆොසිල ඉන්ධන භාවිතය අධෛර්යමත් කෙරෙන අතරම විශේෂයෙන්ම ප්‍රවාහනය, කර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුවලදී කාබන්හරණය දිරිමත් කිරීමටද පියවර ගැනේ. | සූර්ය විදුලිබල පද්ධති ස්ථාපනය කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් තෝරා ගත් **පෞද්ගලික ව්‍යවසායකයන් දිරිමත් කිරීමට අයවැය කතාව මගින් යෝජනා කෙරෙන අතර** මේ සඳහා රු. මිලියන 750 ක් වෙන් කර තිබේ. කෙසේ වෙතත්, සඳහන් කර ඇති අනෙකුත් ක්‍රියාකාරකම් සාක්ෂාත් කර ගැනීම උදෙසා **වෙනත් කිසිදු බදු සහනයක් හෝ අයවැය අරමුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත**. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2.3 | නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල උද්‍යාන බිහි කිරීම, අධිවේගී මාර්ග ඔස්සේ රුක් රෝපණය කිරීම තුළින් නාගරික වෘක්ෂලතා ආවරණය සංවර්ධනය කිරීම සහ කාර්මික පරිශ්‍ර ආශ්‍රිතව ගස් සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය ඇතුළත්ව වනරෝපනය සඳහා උචිත ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා නිශ්චිත පියවර අනුගමනය කෙරෙනු ඇත. | පාසල්, විශ්වවිද්‍යාල, රෝහල් සහ රාජ්‍ය ආයතනවලට ආවේණික වනාන්තර වතු රෝපණය කිරීම උදෙසා වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙනුවෙන් **රු. මිලියන 10 ක් වෙන් කර ඇත**.<br><br>මීට අමතරව, වනාන්තර සංරක්ෂණය හා කඩොලාන පද්ධති සංරක්ෂණය කිරීම වෙනුවෙන් රු. මිලියන 121 ක් ද නව වනාන්තර වගා කිරීම උදෙසා රු. මිලියන 545 ක් ද වනජීවී සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙන් කර තිබේ. |
| **3** | **වෙරළ සංරක්ෂණය** | |
| 3.1 | දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු වෙමින් පවතින වෙරළ ඛාදනය අවම කිරීම සඳහා කඩිනම් පියවර ගනු ලැබේ. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් **වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණය වෙනුවෙන් රු. මිලියන 518 ක් වෙන් කර තිබේ.** |
| 3.2 | සුව දිවිමග වැඩසටහන - තිරසාර පරිසර ප්‍රතිපත්තියක් සකස් කිරීම තුළින් වායු, ජල හා පාංශු දූෂණය වැළැක්වීම මගින් සෞඛ්‍යසම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම. | **පරිසර දූෂණය වැළැක්වීමේ සහ තිරසාර පරිසර ප්‍රතිපත්තියේ පුළුල් ක්‍රියාකාරිත්වය වෙනුවෙන්** පරිසර අමාත්‍යාංශය **රු. මිලියන 97 ක මුදලක් වෙන් කර ඇත**. මෙහිදී රු. මිලියන 50 ක සහ රු. මිලියන 12 ක වටිනාකමකින් යුතු මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් මෙම වසරේදී හඳුන්වා දී තිබේ.<br><br>නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වෙරළ ඛාදනය වැළැක්වීම ඉලක්ක කරගත් ව්‍යාපෘති වෙනුවෙන්ද රු. මිලියන 563 ක් වෙන් කර තිබේ. |

# 6. අධ්‍යාපන අංශය

ප්‍රහත අමාත්‍යාංශවල වියදම් සඳහා වෙන් කර ඇති මුදල් අධ්‍යාපන අංශය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදනවලට ඇතුළත් වේ.[2] **සාමාන්‍ය අධ්‍යාපනය** - අධ්‍යාපන අමාත්‍යාංශය (සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ වියදම්); කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය (කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ); **උසස් අධ්‍යාපනය**[3] - අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපනයට අදාළ වියදම්), අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; **තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය**[4] (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ); **වෙනත්** - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

## විශ්වවිද්‍යාල අධ්‍යාපනය හැර අධ්‍යාපන කටයුතු සඳහා සිදු කර ඇති අනෙකුත් වියදම් විශාල ලෙස නොවෙනස්ව පවතී.

**6.1 ප්‍රදර්ශිතය:** අධ්‍යාපන අංශයේ වියදම් සාරාංශය

***වටිනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන් | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **අධ්‍යාපන අංශය** | **158.9** | **162.0** | **175.2** | **8.1%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *5.4%* | *4.6%* | *4.6%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *1.1%* | *1.0%* | *1.0%* | |
| සාමාන්‍ය අධ්‍යාපනය | 78.07 | 79.14 | 78.28 | **-1.1%** |
| | 2.6% | 2.2% | 2.1% | |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය | 71.05 | 73.00 | 76.79 | **5.2%** |
| | 2.4% | 2.1% | 2.1% | |

2 අධ්‍යාපන අංශයට සම්බන්ධයක් නොමැති වැය ශීර්ෂ බැහැර කරනු පිණිස අමාත්‍යාංශ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වෙනස් කර තිබේ.

3 2019 වසර සඳහා මෙම අංශයට නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන් කර තිබූ අදාළ ප්‍රතිපාදන ඇතුළත් විය.

4 කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධනය සහ වෘත්තීය පුහුණුව හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන අංශය වෙනුවෙන් වෙන් කර තිබුණු මුදල් 2019 වසරේදී මෙම අංශයට ඇතුළත් විය.


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන් | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව | 9.73<br>0.3% | 9.82<br>0.3% | 10.07<br>0.3% | **2.6%** |
| වෙනත් | 0.04<br>0.0% | 0.04<br>0.0% | 0.05<br>0.0% | **5.9%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 10.0<br>0.3% | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ.දුරස්ථ අධ්‍යාපනය (රු.මිලියන 3,000)., වෘත්තීය අධ්‍යාපනය (රු.මිලියන 3,000), ග්‍රාමීය පාසල් සංවර්ධනය (රු.මිලියන 3,000) සහ විශ්වවිද්‍යාල යටිතලපහසුකම් (රු.මිලියන 1,000) සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

## අධ්‍යාපනයට අදාළව තථ්‍ය වශයෙන් වැය කරන ලද ප්‍රාග්ධන වියදම අයවැය හරහා වෙන් කළ වියදම්වලට වඩා සැලකිය යුතු ලෙස අඩු වේ

**6.2 ප්‍රදර්ශිතය:** අධ්‍යාපන අංශය සඳහා වැය කර ඇති මුදල්, රු. බිලියනවලින්, 2015-2019



## ගතවූ වසරවලදී සාමාන්‍ය අධ්‍යාපනය වෙනුවෙන් සිදු කර ඇති වියදම් ආශ්‍රිතව සැලකිය යුතු මට්ටමේ හිඟයක් පවතී

**6.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව තථ්‍ය වියදම්වල) |
|---|---|---|
| **අධ්‍යාපන අංශය** | **9.2%** | **26.3%** |
| සාමාන්‍ය අධ්‍යාපනය | 7.6% | 32.0% |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය | 13.4% | 12.1% |
| තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව | 5.1% | 21.7% |
| වෙනත් | 9.5% | 16.4% |

### විශ්ලේෂණය

අධ්‍යාපන අංශය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන 2019 සිට 2021 අතර කාලය තුළ ද.දේ.නි. හි 1% ලෙස ද 2020 සිට 2021 අතර කාලය තුළ ද.දේ.නි. හි 4.6% ක් ලෙස ද නොවෙනස්ව පැවත ඇත.

කේවල සාධක සැලකිල්ලට ගැනීමේදී මෙම අංශයේ වියදම් ගත වූ වර්ෂය හා සැසඳීමේදී 2021 දී රු.බිලියන 13.2 කින් ඉහළ ගොස් තිබේ. කෙසේ වෙතත්, රජයේ මුළු අයවැයට සමානුපාතිකව සලකා බැලූ විට මෙම අංශය වෙනුවෙන් වෙන් කරන ප්‍රතිපාදන අඩු වෙමින් පවතී. අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කළ මුදල 2020 දී 5.4% ක් ලෙස පැවත ඇති අතර එය 2021 දී 4.6% දක්වා පහත බැස තිබේ.

සාමාන්‍ය අධ්‍යාපනය සහ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව වෙනුවෙන් වෙන් කර ඇති මුදල් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වියදම් කළ මුදලට වඩා අඩු වේ. 2021 වසරේදී සාමාන්‍ය අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කළ මුදල 1.1% කින් අඩු වී ඇති අතර තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සඳහා වූ වියදම් 2.6% කින් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. ඓතිහාසික වශයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සිදු කර ඇති වියදම්වලට වඩා අඩු වර්ධන අනුපාත සහ පූර්ණ වශයෙන් ප්‍රතිපාදන වියදම් නොකිරීමේ තත්ත්වය වඩා වැඩි වශයෙන් පැවතීම මෙම අංශ දෙක ආශ්‍රිතව දැකිය හැකි විය.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අධ්‍යාපන අංශය යටතේ සඳහන් ප්‍රතිපත්ති බොහොමයක් සඳහා මුදල් වෙන් කොට ඇති බව පෙනී යයි. අධ්‍යාපන අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් ඒ හා සබැඳි නිරීක්ෂණ පහත 6.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**6.4 ප්‍රදර්ශිතය:** 2021 වසර සඳහා අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනසමඟ සැසඳීමේදී රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **සාමාන්‍ය අධ්‍යාපනය** | |
| 1.1 | නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් ලෙස මුදල් වෙන් කිරීම | **සාමාන්‍ය අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් වැඩි කර නොමැත**. සත්‍ය වශයෙන්ම, 2020 සමඟ සැසඳීමේදී 2021 සඳහා වෙන් කර ඇති මුදල් රු.බිලියන 0.86 කින් අඩු වී ඇත. 2019 සමග සැසඳීමේදී එම මුදල් වෙන් කිරීම නොවෙනස්ව පවතී. |
| 1.2 | අවශ්‍යතා සහිත පාසල් සඳහා යටිතලපහසුකම් සහ නවීන තාක්ෂණය ලබා දීම සහ දුෂ්කර හා දුරබැහැර ප්‍රදේශවල පිහිටි පාසල්වල ගුරුවරුන් සඳහා අමතර දීමනා ලබා දීම. | අවශ්‍යතා සහිත පාසල් වෙනුවෙන් විශේෂිත මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත්, සමස්ථයක් ලෙස යටිතලපහසුකම් සංවර්ධනය උදෙසා වෙන් කළ මුළු මුදල් පාසල් පහසුකම් වැඩිදියුණු කිරීම සහ සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ වියදම් ශීර්ෂ යටතේ ආවරණය කර තිබේ. 2021 වසරේදී එම ශීර්ෂ දෙක සඳහා වෙන් කර ඇති මුළු මුදල රු.මිලියන 4,469 ක් වන අතර මෙය 2020 වසරේ සිට රු.මිලියන 13,491 ක අඩු කිරීමකි. |
| 1.3 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ඇති පාසල් තුනක් (03) ක් සහ සියලු ම පළාත් පාසල් ජාතික පාසල් මට්ටමට වැඩිදියුණු කරනු ලැබේ. | ජාතික පාසල් පිහිටුවීම සඳහා කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ **අභිනවයෙන් මුදල් වෙන් කර තිබේ**.<br><br>ජාතික පාසල් දැනට නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජාතික පාසල් පිහිටුවීම වෙනුවෙන් රු.මිලියන 950 ක් වෙන් කර ඇත.<br><br>ජාතික පාසල් 1,000 ක් දක්වා ද්විතීයික පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා රු.මිලියන 1,000 ක් වෙන් කර ඇත. එමෙන් ම, සෑම දිස්ත්‍රික්කයක ම ත්‍රෛභාෂා ජාතික පාසල් බිහි කිරීම වෙනුවෙන් රු. මිලියන 500 ක මුදලක් වෙන් කර ඇත.<br><br>ග්‍රාමීය පාසල් සංවර්ධනය කිරීම සහ ජාතික පාසල් 1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන උදෙසා 2021 අයවැය කතාව මගින් රු.මිලියන 3,000 ක අමතර මුදලක් වෙන් කර තිබේ. |
| 1.4 | අනිවාර්ය ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර ඉන් අනතුරුව එකී ගුරුවරුන් රජයේ වැටුපක් ලැබීමට සුදුසුකම් ලබති | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරු සංවර්ධනය සඳහා වැය කිරීමට වෙන් කර ඇති මුළු වියදම රු.මිලියන 3,604 සිට රු.මිලියන 3,271 දක්වා 2021 දී පහත බැස තිබේ. කෙසේ වෙතත්, **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ 2021 දී ගුරු පුහුණු හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වැඩිදුර රු.මිලියන 1,200 ක් වෙන් කර තිබේ**. මෙය අමාත්‍යාංශයේ අයවැයෙන් ආසන්න වශයෙන් 60% කි. |
| 1.5 | සෑම ග්‍රාම නිලධාරී වසමක ම මධ්‍යම රජයේ අධීක්ෂණ යාන්ත්‍රණය යටතේ එක් පෙර පාසලක් සහ එක් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම. | කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිය අයවැයෙන් **දළ වශයෙන් 3% ක කොටසක් පෙර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වෙනුවෙන් වෙන් කර ඇත** (රු.මිලියන 967). ඒ අතරින් ද වැඩිම මුදල් ප්‍රමාණයක්(රු.මිලියන 500) වෙන් කොට ඇත්තේ සෑම ග්‍රාම නිලධාරී වසමකම පෙර පාසලක් ආරම්භ කිරීම සඳහා වන අතර දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ප්‍රජා මධ්‍යස්ථාන වෙනුවෙන් රු.මිලියන 20 ක් වෙන් කර ඇත. |

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 1.6 | ප්‍රාථමික පාසල් “දරුවන්ට හිතකර පාසල්” බවට සංවර්ධනය කෙරෙනු ඇති අතර ඒ සඳහා ගුරු සහායකයන් 50,000 ක් බඳවා ගැනීමට නියමිත ය. | **දරුවන්ට හිතකර පාසල් සංවර්ධනය කිරීම වෙනුවෙන්** කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් **2021 වසර සඳහා රු.මිලියන 400 ක් වෙන් කර ඇත**.<br><br>මෙම අංශයට අදාළ ප්‍රධාන අමාත්‍යාංශ තුනක් යටතේ වැටුප් හා වේතන වෙනුවෙන් 2021 සඳහා වෙන් කර ඇති මුදල රු.බිලියන 30.9 කි. මෙය 2020 දී වෙන් කරන ලද මුදල සමග සංසන්දනය කිරීමේදී සුළු වශයෙන් අඩු කරන ලද මුදලකි(රු.බිලියන 31.4). ඒ අනුව, ගුරු සහායකයන් 50,000 ක් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට මෙමගින් සහායක් නොලැබේ. |
| 1.7 | පාසල් නිල ඇඳුම්,පාවහන් සහ පාසල් පොත් මලු මිල දී ගැනීම සඳහා අවශ්‍යතා ඇති පාසල් සිසුන් හට සහන මිල යටතේ වවුචර බෙදා හරිනු ලැබේ. | කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශය විසින් පාසල් නිල ඇඳුම් හා පාවහන් ලබා දීම උදෙසා **රු.මිලියන 4,200 ක මුළු මුදලක් වෙන් කර ඇත.** 2020 දී ද ඒ සඳහා එම මුදල් ප්‍රමාණයම වෙන් කරන ලදි. 2019 දී එම වියදම ආසන්න වශයෙන් රු.මිලියන 4,429 ක් පමණ විය. |
| 1.8 | පාසල් ආශ්‍රිතව පෝෂ්‍යදායී ආහාර සලාකයක් ලබා දීම තුළින් පාසල් සිසුන්ගේ පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. | පෙර පාසල්, ප්‍රාථමික පාසල් සහ ද්විතීයික පාසල් සිසුන් සඳහා **ආහාර ලබා දීම වෙනුවෙන් ද රු. මිලියන 5,936 ක මුදලක් වෙන් කර ඇත**. |
| **2** | **උසස් අධ්‍යාපනය** | |
| 2.1 | පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දහ අට (18) විශ්වවිද්‍යාල අධ්‍යයන පීඨ බවට පරිවර්තනය කිරීම. | මෙම යෝජනා සඳහා වෙන් කෙරෙන මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක් 2021 අයවැය ඇස්තමේන්තුවලින් නොසැපයේ.**<br><br>කෙසේ වෙතත්, 2019 දී රු.බිලියන 23.7 ක් ලෙස පැවැති අධ්‍යාපන අංශයේ ප්‍රාග්ධන වියදම් 2020 දී රු.බිලියන 20.9 දක්වා අඩු වී ඇති අතර 2021 සඳහා ඇස්තමේන්තුවලට අනුව ඉන් අනතුරුව රු.බිලියන 20.7[5] ක් ලෙස ස්ථාවරව වෙන් කර තිබේ. සමස්ථයක් ලෙස බැලූ විට මෙය 2019 සිට 13% ක පහත බැසීමකි. |
| 2.2 | විශ්වවිද්‍යාල සුහුරු ඉගෙනුම් විශ්වවිද්‍යාල බවට හැරවීම තුළින් 21 වන සියවසේ අවශ්‍යතා ඉටු කළ හැකි පරිදි විශ්වවිද්‍යාල පද්ධතිය වැඩිදියුණු කොට සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියලුම යටිතලපහසුකම් ලබා දීම. | |
| 2.3 | ගුවන් සේවා අධ්‍යයන විශ්වවිද්‍යාලයක්, නාවුක විශ්වවිද්‍යාලයක් සහ පවතින සෞන්දර්ය විශ්වවිද්‍යාලවලට අනුබද්ධිත ‘විශ්වවිද්‍යාල විද්‍යාපීඨ’ 10 ක් ස්ථාපිත කිරීම. | |
| 2.4 | විශ්වවිද්‍යාල සිසුන් සඳහා වන මහපොළ මූල්‍යාධාර වැඩසටහන ප්‍රමාණවත් ලෙස ඉහළ නංවනු ලැබේ. | **මහපොළ ශිෂ්‍යාධාර සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය, මීට පෙර වසරවල වෙන් කරන ලද මුදලට සමානකමක් දක්වයි.** 2020 දී මේ සඳහා වෙන් කර තිබූ රු. මිලියන 2,125 සහ 2019 දී වෙන් කර තිබූ රු.මිලියන 1,964 හා සැසඳීමේදී 2021 දී වෙන් කර ඇති මුදල රු. මිලියන 2,000 කි. |

5 2019 වසර සඳහා මෙම අංශයේ වියදම් අතරට එවක පරිසර අමාත්‍යාංශය යටතට වාර්තා කළ මහවැලි සංවර්ධන කටයුතුවලට අදාළ වියදම්ද ඇතුළත් විය

| # | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **3** | **තාක්ෂණික හා වාත්තිය අධ්‍යාපනය හා පුහුණුව** | |
| 3.1 | 'One TVET' සංකල්පය හඳුන්වා දීම තුළින් වෘත්තීය පුහුණු ආයතන ප්‍රමිතිගත කිරීම සහ නිසි ලෙස බෙදීගිය තාක්ෂණික විශ්වවිද්‍යාල විද්‍යාපීඨ පද්ධතියක් පිහිටුවීම. | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වසරේදී **'One TVET' සංකල්පයට අදාළ ක්‍රියාකාරකම් වෙනුවෙන් රු. මිලියන 5 ක් වෙන් කර තිබේ.**<br><br>මීට අමතරව, 'One TVET' සංකල්පය යටතේ ප්‍රමිතිගත කරනු ලැබෙන පෞද්ගලික අංශයේ ආයතන සිය ආයතන සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව අවම වශයෙන් 50,000 ක් දක්වා හෝ දෙගුණ කරන්නේ නම් එකී ආයතන සඳහා බදු සහන කාලයක් ලබා දීමේ යෝජනාවක් ද 2021 අයවැය කතාව මගින් හඳුන්වා දෙනු ලැබ තිබේ. |
| 3.2 | වෘත්තීය අධ්‍යාපනය ඉලක්ක කර ගනිමින් අංග සම්පූර්ණ දමිළ මාධ්‍ය ගුරු පුහුණු පාසලක් සහ විවෘත විශ්වවිද්‍යාලයේ ශාඛාවක් හැටන් ප්‍රදේශයේ ස්ථාපිත කිරීම. | මෙම යෝජනාව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්බන්ධ **කිසිදු විශේෂිත තොරතුරක් 2021 අයවැය ඇස්තමේන්තුවලින් නොසැපයේ.** |

# 7. කෘෂිකර්ම, වාරිමාර්ග සහ ධීවර අංශය

කෘෂිකර්මාන්ත අංශය වෙනුවෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදන මගින් පහත ක්ෂේත්‍ර, ඒවාට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සැලකිල්ලට ගනු ලැබේ:

- **කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය ආර්ථිකය** - කෘෂිකර්ම අමාත්‍යාංශය;වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය; පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය; පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය.

- **වතු වගා සහ අපනයන භෝග වගාව** - වැවිලි අමාත්‍යාංශය;සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය; උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.[6]

- **ධීවර** - ධීවර අමාත්‍යාංශය; විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය.

- **වාරිමාර්ග** - වාරිමාර්ග අමාත්‍යාංශය; මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතලපහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ  හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

6 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම අංශයේ වියදම් ගණනයන්ගෙන් බැහැර කර තිබේ.

## ආංශික වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

**7.1 ප්‍රදර්ශිතය:** කෘෂිකර්ම අංශයේ වියදම් සාරාංශය

***වටිනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **කෘෂිකර්ම, සහ ධීවර කර්මාන්ත අංශය** | **124.9** | **137.8** | **164.5** | **19.4%** |
| *සෘජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *4.22%* | *3.88%* | *4.34%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *0.83%* | *0.86%* | *0.94%* | |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 71.1<br>2.40% | 16.4<br>0.46% | 24.1<br>0.64% | **47.2%** |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6.3<br>0.21% | 5.9<br>0.17% | 7.2<br>0.19% | **21.2%** |
| වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | 9.0<br>0.30% | 13.5<br>0.38% | 18.7<br>0.49% | **38.2%** |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 9.0<br>0.30% | 9.5<br>0.27% | 10.0<br>0.26% | **5.4%** |
| පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 35.1<br>0.99% | 35.7<br>0.94% | **1.8%** |
| පශු සම්පත්, ගොවිපොල ප්‍රවර්ධන හා කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 1.4<br>0.05% | 1.8<br>0.05% | 2.8<br>0.07% | **61.6%** |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 1.4<br>0.05% | 1.3<br>0.04% | 1.4<br>0.04% | **14.6%** |
| ධීවර අමාත්‍යාංශය | 0.75<br>0.03% | 1.36<br>0.04% | 4.58<br>0.12% | **237%** |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 0.75<br>0.03% | 0.85<br>0.02% | 0.76<br>0.02% | **-11.0%** |


| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 තථ්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 4.2<br>0.12% | 3.8<br>0.10% | **-10.9%** |
| වැවිලි අමාත්‍යාංශය | 6.5<br>0.22% | 1.4<br>0.04% | 1.3<br>0.03% | **-9.3%** |
| සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 0.96<br>0.03% | 5.44<br>0.15% | 5.87<br>0.15% | **7.9%** |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 0.96<br>0.03% | 1.41<br>0.04% | 1.33<br>0.04% | **-5.7%** |
| පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 2.2<br>0.06% | 2.5<br>0.07% | **17.8%** |
| උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු සුළු වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 2.3<br>0.07% | 2.8<br>0.07% | **20.2%** |
| වාරිමාර්ග අමාත්‍යාංශය | 12.2<br>0.41% | 50.4<br>1.42% | 46.6<br>1.23% | **-7.6%** |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 12.2<br>0.41% | 11.6<br>0.33% | 14.7<br>0.39% | **26.3%** |
| මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතලපහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 3.5<br>0.10% | 7.3<br>0.19% | **104.8%** |
| ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | දත්ත නොමැත | 0.1<br>0.00% | 3.1<br>0.08% | **2563.8%** |
| වෙනත්* | 23.1<br>0.78% | 0.0<br>0.00% | 0.0<br>0.00% | **0.0%** |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 5.4<br>0.14% | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල

වියදම්වලට අන්තර්ගත කර තිබේ. වැව්ලි අංශය (රු. මිලියන 2,000), බිංදු ජල සම්පාදනය (රු. මිලියන 1,500), වැව් ප්‍රතිසංස්කරණය (රු. මිලියන 1,000), ධීවර සංස්ථාව (රු. මිලියන 500), මත්ස්‍ය ගොවිපළ සංවර්ධනය (රු. මිලියන 200) සහ මිරිදිය ධීවර කර්මාන්තය (රු. මිලියන 150) ආදී අංශ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

**7.2 ප්‍රදර්ශිතය:** කෘෂිකර්ම හා ධීවර කර්මාන්ත අංශය සඳහා වැය කළ මුදල්, රු. බිලියනවලින්, 2015-2019




**7.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව තථ්‍ය වියදම්වල) |
|---|---|---|
| **කෘෂිකර්ම, සහ ධීවර කර්මාන්ත අංශය** | **-3.9%** | **18.3%** |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 3.6% | 9.6% |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2.3% | 19.8% |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | -19.2% | 29.6% |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | -17.2% | 32.4% |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 9.4% | 15.3% |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | -1.7% | 17.5% |
| අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති අනෙකුත් ප්‍රතිපාදන | -4.5% | 19.2% |

## විශ්ලේෂණය

ගත වූ වසර සමග සංසන්දනය කිරීමේදී 2021 දී මෙම අංශය සඳහා වෙන් කරන ලද මුදල් සැලකිය යුතු ලෙස 19.4% කින් ඉහළ ගොස් තිබේ. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී මෙම අංශයේ වියදම් ඉහළ නැගීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සමස්ථ අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී 2021 වසරේදී පෙරළා 4.3% දක්වා ඉහළ නැගීමට පෙර මෙම වියදම් 2020 දී 4.2% සිට 3.9% දක්වා අඩු කර ඇත.

2021 සඳහා මෙම අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉහළ යාමට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්‍ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වැඩි වශයෙන් මුදල් වෙන් කර තිබීම යි. මීට අමතරව, 2021 වසර සඳහා වාරිමාර්ග හා ධීවර කර්මාන්ත අංශ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනද මඳ වශයෙන් ඉහළ ගොස් ඇති.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

'සෞභාග්‍යයේ දැක්ම' රජයේ නිල ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කෘෂිකර්ම අංශය යටතේ සඳහන් ප්‍රතිපත්ති බොහොමයක් සඳහා මුදල් වෙන් කොට නොමැති බව පෙනී යයි. ඇතැම් අවස්ථාවලදී මුදල් වෙන් කර ඇති විට පවා අතීතයට සාපේක්ෂව එම මුදල් ප්‍රමාණය අඩු වී තිබේ. කෘෂිකර්ම අංශයට අදාළ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි සඳහන් වී හා සබැඳි නිරීක්ෂණ පහත 7.4 ප්‍රදර්ශිතයෙහි දක්වා තිබේ.

**7.4 ප්‍රදර්ශිතය:** 2021 වසර සඳහා අයවැයෙන් වෙන් කරන ලද මුදල සමඟ සැසඳීමේදී රජයේ කෘෂිකර්ම ප්‍රතිපත්ති රාමුව

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| **1** | **සාමාන්‍ය කෘෂිකර්මය** | |
| 1.1 | කෘෂිකර්ම රක්‍ෂණ යෝජනා ක්‍රමයක්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක්, අඩු පොලී කෘෂි ණය යෝජනා ක්‍රමයක්, භෝග රක්‍ෂණ යෝජනා ක්‍රමයක්, පාංශු පොහොර කළමනාකරණ පද්ධතියක්, කෘෂි භෝග කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම. | **ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වැව්ලි භෝග රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා පිළිවෙළින් රු. මිලියන 4,000 ක් සහ රු. මිලියන 1,000 ක් වෙන් කර තිබේ.** මෙය කෘෂිකර්ම අමාත්‍යාංශයට වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදනවලින් 21% කි. කෙසේ වෙතත්, 2019 වසරේදී **වැව්ලි භෝග රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා වෙන් කර තිබුණු** රු. මිලියන 1,988 ක ප්‍රතිපාදන 2020 දී රු. මිලියන 1,514 දක්වා **අඩු කර තිබේ**. |
| 1.2 | මීට පෙර අවස්ථාවල දී සිදු වූ වගා හානි සඳහා ගොවි ජන ප්‍රජාව වෙත ගෙවීමට නියමිත වන්දි ගෙවා අවසන් කිරීම. | 2021 වසර සඳහා වූ අයවැය ඇස්තමේන්තු මගින් මෙම විශේෂිත යෝජනා පිළිබඳ **තොරතුරු ලබා නොදේ**. |
| 1.3 | ලාභ නුපදවන ඉඩම් ලාභ උපදවන ඉඩම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්‍ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ 2021 වසරේදී **අත්හැර දැමූ කුඹුරු නැවත වගා කිරීම උදෙසා රු. මිලියන 1,000 ක් වෙන් කර තිබේ**. මෙය 2019 වසරේදී මේ සඳහා වෙන් කර තිබුණු රු. මිලියන 1,177 ක මුදලේ සිට මෙන්ම 2020 දී වෙන් කර තිබුණු රු. මිලියන 1,343 ක මුදලේ සිටද පහත බැස තිබේ. |
| 1.4 | හරිතාගාර, පස රහිත වගාව (hydroponics) සහ දිය-මත්ස්‍ය වගාව (aquaponics) ජනප්‍රිය කරවීම සහ එකී කෘෂි ව්‍යාපාරික කටයුතුවල නියැළීමට තරුණ ප්‍රජාව දිරිමත් කිරීම උදෙසා ආනයන තීරුබදු ප්‍රතිලාභ හා අඩු පොලී ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම. | තරුණ ව්‍යවසායකයන් දිරිමත් කිරීමේ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස ගොවි ජන ප්‍රජාව වෙත **ණය හා ප්‍රදාන ලබා දීම වෙනුවෙන් රු. මිලියන 2,500 ක් වෙන් කර තිබේ**.<br><br>කෘෂිකර්මයෙහි නියැළෙන **තරුණ ව්‍යවසායකයන් 1,000 ක් වෙත දැනුම හා මූල්‍ය සහාය ලබා දීම උදෙසා රු. මිලියන 500 ක් වෙන් කර තිබේ**. |

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 1.5 | තරුණ කෘෂි ව්‍යාවසායකයන් පිරිසක් ප්‍රවර්ධනය කිරීම උදෙසා නවීන කෘෂි තාක්ෂණික දැනුම, ගොවි කටයුතු ආශ්‍රිත ක්‍රමවේද, කෘෂිකාර්මික ආදායම ස්ථායීකරණ ක්‍රමවේද, අලෙවිකරණ ක්‍රමවේද, පහසු ණය පහසුකම් සහ බදු සහන හා ප්‍රතිලාභ ලබා දීමට පියවර ගැනේ. | සමස්ථයක් ලෙස 2021 වසර සඳහා මෙම ක්‍රියාකාරකම් වෙනුවෙන් රජය විසින් කෘෂි අයවැයෙන් 12% ක් වෙන් කර තිබේ.<br><br>ගොවි කටයුතුවල (කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සත්ත්ව ගොවිපොළ පාලනය ඇතුළත්ව) නිරත වී සිටින පුද්ගලයන් සහ සමාගම් ඉදිරි වසර 5 ක කාලය සඳහා **බදුවලින් නිදහස් කෙරෙනු ඇති බවට ද 2021 අයවැය කතාව යෝජනා කරයි.** |
| 1.6 | වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං ඇට හා කව්පි, ළුණු සහ අර්තාපල් වගාව ප්‍රවර්ධනය කිරීම. | විවිධ දේශීය භෝග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් උදෙසා වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් **රු. මිලියන 6,538 ක් වෙන් කර ඇත.** මෙය මෙම අමාත්‍යාංශයේ මූලික කාර්යභාරවලින් එකක් වන අතර, වෙන් කර ඇති මෙම මුදල අමාත්‍යාංශය සඳහා වූ මුළු අයවැයෙන් 35% කි |
| 1.7 | තාක්ෂණික සහාය, යටිතලපහසුකම් සහ ආයෝජන පහසුකම් ලබා දෙමින් කලාපීය මට්ටමින් සමූපකාර ගොවිපළ නිෂ්පාදන ක්‍රමවේදයක් බිහි කෙරෙනු ඇත. | මෙම යෝජනාව  සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධ **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ.** |
| 1.8 | සුව දිවිමග වැඩසටහන<br><br>- කෘෂි රසායන සහ ආකලනවලින් තොර සෞඛ්‍යමත් ආහාර වේලක් ලබා දීම<br><br>- සෑම වයස් මට්ටමකම සිටින පුද්ගලයින් අතර නිවැරදි ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම | **වස විස රහිත ආහාර නිෂ්පාදනයට** අදාළ වැඩසටහන සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් **රු. මිලියන 250 ක් වෙන් කර තිබේ.**<br><br>එමෙන්ම, වස විස රහිත ආහාර නිෂ්පාදනයට අදාළ වැඩසටහන් සඳහා වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් ද රු. මිලියන 70 ක මුදලක් වෙන් කර ඇත. |
| 1.9 | කෘෂිකාර්මික පර්යේෂණ දැනුම සහ නවීන තාක්ෂණික නිපුණතා ප්‍රචාරණය කරනු පිණිස ''කෘෂිකාර්මික ආයතනයක්'' ක්‍රියාත්මක කිරීම. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ.** |
| **2** | **කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ කුකුළු ගොවිපළ පාලනය** | |
| 2.1 | උතුරු පළාත ආශ්‍රිතව කිරි, බිත්තර, සත්ත්ව හා මත්ස්‍ය නිෂ්පාදන, එළවළු සහ පලතුරු ආදී පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.<br><br>උතුරු පළාත තුළ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අඩු මිල ගණන් සහ පහසු ගෙවීමේ කොන්දේසි යටතේ කිරි ගොවීන් හා සමූපකාර සමිති වෙත යාන්ත්‍රික කිරි නිෂ්පාදන උපකරණ ලබා දීම. | **කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන්** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය **රු. මිලියන 1,667 ක් (අයවැයෙන් 59% ක්) වෙන් කර ඇත.** මේ සම්බන්ධයෙන් වූ විශාලතම වැඩසටහන, සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවීන් ප්‍රවර්ධනය කිරීමට අදාළව අභිනවයෙන් හඳුන්වා දුන් වැඩසටහනකට සම්බන්ධ වේ (රු. මිලියන 450 ක්).<br><br>කෙසේ වෙතත්, **උතුරු පළාත තුළ** මෙවැනි **වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම **සම්බන්ධයෙන් කිසිදු විශේෂිත සඳහනක්** 2021 අයවැය ඇස්තමේන්තුවල **ඇතුළත් නොවේ.** |
| 2.3 | ගුණාත්මකභාවයෙන් යුතු ගව ආහාර මත තීරුබදු අඩු කිරීම. | **තීරුබදු අඩු කිරීම් කිසිවක් සිදු කර නොමැත.** |

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2.4 | කිරි ගබඩා කිරීමේ පහසුකම් වැඩි කිරීම උදෙසා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන සුළු පරිමාණයේ ශීතකරණ පහසුකම් හඳුන්වා දීම. | **මුදල් වෙන් කර නොමැත** |
| 2.5 | කුඩා භූමි ප්‍රදේශ තුළ වැඩි ගවයින් සංඛ්‍යාවක් ගාල්කර තබා ගැනීම සඳහා "සිරස් ගව හල් ක්‍රමයක්" හඳුන්වා දීම සහ මධ්‍ය හා මහා පරිමාණ ගව පට්ටි ගොඩනැගීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් ලබා දීම. | **මුදල් වෙන් කර නොමැත** |
| 2.6 | අපනයනය සඳහා මස් හා බිත්තර:<br>- කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කිරීම සහ අපනයන සිදු කරන ලෙස මහා පරිමාණ නිෂ්පාදකයන් දිරිමත් කිරීම.<br><br>ගෘහස්ථ මට්ටමින් කාබනික මාංශ නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම.<br><br>සත්ත්ව ගොවිපළ සහ නිෂ්පාදනාගාර වෙත ජාත්‍යන්තර ප්‍රමිති හා කාර්යක්ෂම අධීක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම. | **සත්ත්ව පාලනය හා සබැඳි නිපැයුම් ප්‍රවර්ධනය කිරීම ආශ්‍රිත වැඩසටහන් උදෙසා** පශු සම්පත්, ගොවිපොල ප්‍රවර්ධන හා කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් **රු. මිලියන 129 ක් වෙන් කර ඇත.** මෙම අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර ඇති මුදල්වලින් වැඩි ප්‍රමාණයක් යොමු වන්නේ දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අමාත්‍යාංශ අයවැයෙන් සියයට 5 ක් පමණ නියෝජනය වන සත්ත්ව ගොවිපල ආශ්‍රිත ක්‍රියාදාම ආදිය වෙනුවෙනි. |
| 2.7 | ජල පරිභෝජනයෙන් උපරිම සකසුරුවම්දායී ප්‍රතිලාභ උදාකර ගැනීම උදෙසා බිංදු ජලවහන සහ වතුර මල් ක්‍රම හඳුන්වා දීම. | **බිංදු ජලවහන පද්ධති සහ ජල සංරක්ෂණය වෙනුවෙන් රු. මිලියන 1,500** ක් වෙන් කිරීමේ යෝජනාවක් ද 2021 අයවැය කතාව මගින් හඳුන්වා දෙයි. |
| **3** | **ධීවර කර්මාන්තය** | |
| 3.1 | ධීවර යාත්‍රා<br>- නවීන තාක්ෂණික හා මෙහෙයුම් පහසුකම් සහිත වැඩිදියුණු බහු දින ධීවර බෝට්ටු සැලකිය යුතු සංඛ්‍යාවක් ලබා ගැනීම, සාගර ජලය යොදා ගෙන ශීතකරණ පද්ධති බිහි කිරීම සහ එවැනි උපකරණ සඳහා සූර්යබලය යොදා ගැනීම දිරිමත් කිරීම.<br>- ත්‍රිකුණාමලය ආශ්‍රිතව දැවැන්ත බහු දින ධීවර යාත්‍රා තැනීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ.** |
| 3.2 | ධීවර කර්මාන්තය හා සබැඳි ගෘහස්ථ කර්මාන්ත ආශ්‍රිතව කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ.** |
| 3.3 | මහා පරිමණ හා බදු දින ධීවර යාත්‍රාවලට ඇතුළු වීමට පහසුකම් සලසනු පිණිස ඔළුවිල් ප්‍රදේශයේ පිහිටා ඇති ධීවර වරායද ඇතුළුව දැනට පවතින ධීවර වරායයන් නවීකරණය කිරීම සහ අවශ්‍ය වේ නම් නව වරායයන් ඉදිකිරීම. | **ධීවර වරායයන් සහ නැංගුරම්පළවල් නඩත්තුව, වැඩිදියුණු කිරීම සහ අලුතින් ඉදිකිරීම වෙනුවෙන්** ධීවර අමාත්‍යාංශය සඳහා **රු. මිලියන 2,650 ක් වෙන් කර ඇත.** මීට අදාළව වෙන් කරන ලද විශාලතම මුදල වන රු. මිලියන 1,590 ක මුදල ගන්දර ධීවර වරාය වෙනුවෙන් වෙන් කර ඇති අතර මෙය 2019 වසරේදී ඒ සඳහා වෙන් කරන ලද රු. මිලියන 640 ක මුදල සහ 2020 වසරේදී වෙන් කරන ලද රු. මිලියන 927 ක මුදලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ නංවා තිබේ. |
| 3.4 | නවීන සන්නිවේදන පහසුකම්, ශීතරකණ, ඉන්ධන සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායයන්, නැංගුරම්පළවල් හා යාත්‍රා නවතා තැබීමේ ස්ථාන ගොඩනැගීම. | **ධීවර වරායයන්** සහ නැංගුරම්පළවල් **නවීකරණය කිරීම වෙනුවෙන්** ධීවර අමාත්‍යාංශය **රු. මිලියන 545 ක් වෙන් කර ඇත.** |

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 3.5 | ජාත්‍යන්තර මුහුදු ආශ්‍රිතව ධීවර කටයුතුවල නිරත වීමට අවස්ථාව දේශීය ධීවර සමාගම් වෙත සැලසීම. | මෙම අරමුණ ඉලක්ක කරගත් වැඩසටහන් දෙකක් වෙනුවෙන් ධීවර අමාත්‍යාංශය **රු. මිලියන 56 ක මුදලක් වෙන් කර ඇත** (ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා සම්බන්ධීකරණය සහ චන්ද්‍රිකා තාක්ෂණය ලබා දීම). |
| 3.6 | මූල්‍ය සහාය:<br>- මිරිදිය හා ජලජීවී වගා ධීවර කටයුතු සංවර්ධනය කිරීම උදෙසා අඩු පොලී ණය, බදු ප්‍රතිලාභ, රක්ෂණාවරණ, උපදේශනය සහ වෙළෙඳපොල සම්බන්ධීකරණය ලබා දීම.<br>- අගය දාමය ඔස්සේ මත්ස්‍ය ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු පිණිස වූ නවෝත්පාදනයන් වෙනුවෙන් පොලී රහිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ**. |
| 3.7 | වැව්ලි කටයුතු:<br>- භාවිතයට නොගත් වතු ඉඩම් මල් වගාව සහ කාබනික නිපැයුම් සංවර්ධනය කිරීම සඳහා යොදා ගැනීම.<br>- සමස්ථ වතු අංශයම ආවරණය කරමින් කාර්මික කලාපයක් ස්ථාපිත කිරීම සහ දැනට වසා දමා ඇති කර්මාන්තශාලා නැවත විවෘත කිරීමේ සාධ්‍යතාව විශ්ලේෂණය කිරීම. | මෙම යෝජනා සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක් 2021 අයවැය ඇස්තමේන්තුවලින් නොසැපයේ**. |
| 3.8 | රජයේ හිමිකාරීත්වය යටතේ පවතින වතුවල ඵලදායීතාව ඉහළ නැංවීම උදෙසා කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාවලි සහිතව නැවත වගා කිරීම් සහ පොහොර යෙදීම වෙනුවෙන් ප්‍රාග්ධන සම්පාදනය. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ**. |

# 8. සමාජ සවිබලගැන්වීම් අංශය

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය[7], සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය[8] යනාදියට සමාජ සවිබලගැන්වීම් අංශය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

**2020 වසර සමග සැසඳීමේදී, 2021 දී සමෘද්ධි සහනාධාරය සඳහා වූ අයවැය කප්පාදු කිරීම නිසා සමාජ සවිබලගැන්වීම් අංශය වෙනුවෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදනවල සමස්ථ පහත බැසීමක් දැකිය හැකි වනු ඇත.**

**8.1 ප්‍රදර්ශිතය:** සමාජ සවිබලගැන්වීම් අංශයේ වියදම් සාරාංශය

***වටිනාකම රු. බිලියනවලින්***

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 සත්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| **සමාජ සවිබලගැන්වීම් අංශය** | **357.5** | **408.6** | **393.8** | **-1.12%** |
| *රජයේ වියදම්වල ප්‍රතිශතයක් ලෙස* | *12.1%* | *11.5%* | *10.4%* | |
| *ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස* | *2.38%* | *2.56%* | *2.24%* | |
| කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | 0.4<br>0.0% | 8.0<br>0.2% | 8.3<br>0.2% | **0.00%** |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 0.4<br>0.0% | 0.4<br>0.0% | 0.4<br>0.0% | **0.00%** |

7 සමාජ සවිබලගැන්වීමට අදාළ වන වියදම් පමණක් ඇතුළත් කරනු පිණිස මෙම අමාත්‍යාංශය සඳහා වූ වියදම් වෙනසකට ලක් කර ඇත.


8 ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින වියදම් 2019 වසරේ මෙම අංශයට අදාළ වියදම්වලට ඇතුළත් විය.

| අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | රජයේ වියදම්/ප්‍රතිපාදන | | | ලක්ෂ්‍යමය වෙනස |
|---|---|---|---|---|
| | 2019 සත්‍ය | 2020 සංශෝධිත | 2021 අයවැය | 2020-2021 |
| සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 58.7<br>2.0% | 113.8<br>3.2% | 84.7<br>2.2% | **-0.97%** |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 58.7<br>2.0% | 106.4<br>3.0% | 71.6<br>1.9% | **-1.11%** |
| රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය* | 273.0<br>9.2% | 286.9<br>8.1% | 289.8<br>7.6% | **-0.43%** |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 273.0<br>9.2% | 286.9<br>8.1% | 289.8<br>7.6% | **-0.43%** |
| වෙනත්** | 25.5<br>0.9% | දත්ත නොමැත | දත්ත නොමැත | දත්ත නොමැත |
| 2021 අයවැය කතාවට ඇතුළත් විශේෂිත අතිරේක යෝජනා | දත්ත නොමැත | දත්ත නොමැත | 11.0<br>0.29% | දත්ත නොමැත |

සටහන: ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා 2019 ට අදාළ තථ්‍ය වියදම යටතේත්, 2020 ට අදාළ සංශෝධිත වියදම යටතේත්, රජයේ ආයතනවල වියදම්වලට අන්තර්ගත කර තිබේ. සමෘද්ධි සහනාධාරලාභී පවුල් සවිබල ගැන්වීම (රු. මිලියන 10,000) සහ තරුණ කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම (රු. මිලියන 1,000) සඳහා මුදල් වෙන් කිරීමටද යෝජනා 2021 අයවැය යෝජනාවලට ඇතුළත් වේ.

*මූලාශ්‍ර: අයවැය ඇස්තමේන්තු කෙටුම්පත (2021) සහ අයවැය කතාව (2021)*

**8.2 ප්‍රදර්ශිතය:** සමාජ සවිබලගැන්වීම් අංශය සඳහා වැය කර ඇති මුදල්, රු. බිලියනවලින්, 2015-2019



**8.3 ප්‍රදර්ශිතය:** අතීත අත්දැකීම්, 2015-2019

| දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය | වර්ධනයේ සාමාන්‍යය (තථ්‍ය වියදම්වලින්) | හිඟ මුදලේ සාමාන්‍යය (ඇස්තමේන්තුවලට සාපේක්ෂව සත්‍ය වියදම්වල) |
|---|---|---|
| **සමාජ ආරක්ෂක අංශය** | **7.9%** | **-0.7%** |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 4.2% | 2.9% |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 3.0% | 4.1% |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 11.1% | -3.1% |
| වෙනත් | -2.7% | 6.5% |

### විශ්ලේෂණය

රාජ්‍ය අයවැයෙන් විශාල කොටසක් සමාජ සවිබලගැන්වීම් අංශයට අයත් වේ. සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා සිදු කරන ගෙවීම් සහ විශ්‍රාම වැටුප් ද ඊට ඇතුළත් වීම ඊට හේතුවයි. මේ නිසා, මෙම අංශයේ වියදම් ප්‍රධාන වශයෙන් ම සමන්විත වන්නේ පුනරාවර්තන වියදම්වලිනි. මෙම අංශය රජයේ වියදම්වලින් සියයට 10.4 න් හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 න් සමන්විත වේ.

2019 වසරේදී රු. බිලියන 358 ක් ලෙස පැවැති සමාජ සවිබල ගැන්වීමේ වියදම් 2020 දී සැලකිය යුතු පරිදි රු. බිලියන 408.6 දක්වා ඉහළ ගොස් තිබේ. මෙම ඉහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ රු. මිලියන 38,500 ක වටිනාකමක් සහිතව කෝවිඩ්-19 සහන ප්‍රයත්න සඳහා වැය කරන්නට සිදු වූ අරමුදල් ය. ප්‍රධාන වශයෙන්ම 2020 දී කෝවිඩ්-19 වෙනුවෙන් සිදු කළ සහන සැලසීම් සඳහා වෙන් කර තිබුණු මුදල් බැහැර කිරීම නිසා 2021 දී මෙම වියදම රු. බිලියන 394 දක්වා පහත බැස තිබේ.

## රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අයවැය අපේක්ෂා

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 1 | “ගැමි ලියට රටේ සවිය”<br>- කාන්තා ව්‍යවසායිකාවන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ අගය එකතු කිරීමේ නිපැයුම්වල නියැළීම දිරිමත් කිරීමට වැඩසටහනක් සකස් කිරීම.<br>- අතිශයින් ඉහළ පොලී අනුපාත අයකරන නියාමනය නොවූ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රම හේතුවෙන් වින්දිතයන් බවට පත් වන පුද්ගලයන්ට සහන සැලසීම. | **කාන්තා සංවර්ධනය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා** කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර ඇති මුළු මුදල **රු. මිලියන 129 කි** (අමාත්‍යාංශයේ අයවැයෙන් සියයට 0.42 ක් පමණි). එසේ වෙන් කර ඇති මුදලෙන් රු. මිලියන 90 ක් වෙන් වන්නේ කාන්තාවන් අතර ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම වෙනුවෙනි.<br>සමුද්ධි කාන්තා අලෙවිසැල් පිහිටුවීමට දායක වන දේශීය ව්‍යවසායකයන් සම්බන්ධයෙන් බදු අඩු කිරීමේ යෝජනාවක්ද 2021 අයවැය කතාව මගින් ඉදිරිපත් කෙරිණ. මෙම අලෙවිසැල් සඳහා ණය පහසුකම් හා රක්ෂණාවරණ ලබා දීම උදෙසා රජය වැඩිදුරටත් රු. මිලියන 1,000 ක් වෙන් කරයි.<br>කෙසේ වෙතත්, **නියාමනය නොවූ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවල වින්දිතයන් බවට පත් වන කාන්තාවන් හට සහන සැලසීම වෙනුවෙන්** අයවැය ඇස්තමේන්තු මගින් කිසිදු **මුදල් වෙන් කිරීමක් නිශ්චය නොකෙරේ.** |

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| 2 | දමිළ-මුස්ලිම් සහෝදරත්වය - "පුනර්ජීවන අරමුදල" දියත් කෙරෙනු ඇත. | මෙම යෝජනාව සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක්** 2021 අයවැය ඇස්තමේන්තුවලින් **නොසැපයේ.** |
| 3 | වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන්<br>- වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් සඳහා සුවිශේෂ නිපුණතා/වෘත්තීය පුහුණු වැඩසටහන් ලබා දීම.<br>- වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් හට උපකාර කිරීම උදෙසා ඇමතුම් මධ්‍යස්ථාන පිහිටුවීම. | වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් ඉලක්ක කරගත් වැඩසටහන් වෙනුවෙන් සමෘද්ධි අමාත්‍යාංශය රු. මිලියන 4,370 ක් වෙන් කර ඇත (අමාත්‍යාංශ අයවැයෙන් සියයට 5 කි). කෙසේ වෙතත්, මෙය දිගින් දිගටම දරන්නට සිදු වන වියදමකි. ඉහත කී වැඩසටහන් සඳහා අභිනවයෙන් මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත. |
| 4 | වැඩිහිටි පුද්ගලයන්ට සැලකීම<br>- වියපත් වූ විට මුහුණ පාන්නට සිදු වන අභියෝග සාර්ථක ලෙස ජය ගැනීම සඳහා පංච වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක කිරීම.<br>- වැඩිහිටි උපකාරක වැඩසටහනෙන් අඩු කර ගත් රු. 100/- ක මුදල දැනට පවතින රු. 2,000 ට නැවත එකතු කිරීම සහ මාසික දීමනාව රු. 2500 දක්වා වැඩි කිරීම.<br>- නිර්දේශිත ඖෂධ මිල දී ගැනීම සඳහා වයස අවු. 65 ට වැඩි වියපත් පුද්ගලයන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සහ සෑම මාස හයකට ම වරක් නොමිලේ සෞඛ්‍ය පරීක්ෂණ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීම. | - මෙවැනි **වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම **සම්බන්ධයෙන් විශේෂිත සඳහනක්** 2021 අයවැය ඇස්තමේන්තුවලට **ඇතුළත් වී නොමැත**.<br>- වැඩිහිටි පුද්ගලයන් සඳහා ලබා දෙනු ලබන මූලික සමාජ ආරක්ෂණ ස්වරූපය වන්නේ විශ්‍රාම වැටුප් ගෙවීම යි. 2021 වසර සඳහා ආසන්න වශයෙන් රු. බිලියන 250 ක මුදලක් විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වෙන් කර ඇත. |
| | සමාජ ආරක්ෂාව සහ සුභසිද්ධිය<br>- දිවිනැගුම වැඩසටහන යළි ක්‍රියාත්මක කර එය නැවත සවිමත් කිරීම.<br>- දැනට විශ්‍රාම වැටුප් හිමි නොවන පුද්ගලයන් උදෙසා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම.<br>- මාරාන්තික රෝග වෙනුවෙන් දැනට ලබා දෙන මාසික දීමනා ඉහළ නැංවීම.<br>- වයස අවු. 12 ට අඩු දරුවන් සිටින සහ කිසිදු ආදායම් මාර්ගයක් නොමැති තනි මා-පිය පවුල් සඳහා මාසික දීමනාවක් ලබා දීම. | - දිවි නැගුම වැඩසටහන **සම්බන්ධයෙන් කිසිදු විශේෂිත සඳහනක්** 2021 අයවැය ඇස්තමේන්තුවලට **ඇතුළත් වී නොමැත**.<br>- 2021 වසර සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුනරාවර්තන වියදම් රු. මිලියන 140 සිට රු. මිලියන 125.5 දක්වා 11% කින් ඉහළ ගොස් ඇත.<br>- **වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන මූල්‍ය සහාය 2021 දී 32% කින් ඉහළ ගොස් ඇත** (රු. මිලියන 2,349 සිට රු. මිලියන 1,785 දක්වා)<br>- ග්‍රාම ශක්ති වැඩසටහන සහ තනි මා-පිය පවුල් සඳහා ස්වයං-රැකියා අවස්ථා උදා කිරීමේ වැඩසටහන (ඒකාබද්ධ වෙන් කිරීම් රු. මිලියන 338 කි) වෙනුවට **"සුන්දර ගම" ග්‍රාමීය ආර්ථික නගා සිටුවීමේ වැඩසටහන (2021 දී රු. මිලියන 5,300 ක් වෙන් කර ඇත) දියත් කර ඇත**. |

| | රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා | නිරීක්ෂණ |
|---|---|---|
| | සමෘද්ධි සහනාධාරලාභීන්<br>- සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල තරුණ තරුණියන් වෙත වෘත්තීය පුහුණුව ලබා දීම.<br>- අඩු ආදායම්ලාභී පවුල් වෙත දැනටමත් ලබා දෙන සමෘද්ධි ප්‍රතිලාභ සියල්ලම වැඩි කිරීම. | - **2021 වසර තුළ සමෘද්ධි සහනාධාර සඳහා වියදම් කිරීමට අපේක්ෂිත මුදල රු. මිලියන 53,000 කි**. සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රධාන වියදම ලෙස මුදල් වෙන් කර ඇත්තේ මේ වෙනුවෙනි (මුළු වියදමින් සියයට 63 කි). මෙය, 2020 සමෘද්ධි සහනාධාර සඳහා වෙන් කරන ලද මුදලට සමාන වන අතර (රු. මිලියන 52,688) 2019 සමග සැසඳීමේදී සියයට 19 ක ඉහළ යාමකි.<br>- 2020 වසරේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෝවිඩ් සහන සැලසීම් වෙනුවෙන් රු. මිලියන 38,500 ක මුදලක් වියදම් කර තිබේ.<br>- සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ වැඩසටහන වෙනුවෙන් රු. මිලියන 600 ක ප්‍රාග්ධන වියදම්ද වෙන් කර තිබේ. මෙම ප්‍රතිපාදන 2021 දී නැවත ඉහළ නැංවීමට පෙරාතුව 2020 වසරේදී රු. මිලියන 505 සිට රු. මිලියන 195 දක්වා සැලකිය යුතු ලෙස කප්පාදු කරන ලදී.<br>- එමෙන් ම, සමෘද්ධි සහනලාභී පවුල් සවිබල ගැන්වීම උදෙසා 2021 අයවැය කතාව මගින් අමතර රු. මිලියන 10,000 ක් වෙන් කර තිබේ. |
| | සමෘද්ධි පරිපාලනය<br>- නවීන තාක්ෂණය යොදා ගෙන සියලුම සමෘද්ධි කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම.<br>- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ වැටුප්, දීමනා, උසස්වීම් සහ විශ්‍රාම වැටුප්වලට අදාළ ගැටලු විසඳීම. | - නවීන තාක්ෂණය යොදා ගැනීම හරහා සමෘද්ධි වැඩ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් **කිසිදු විශේෂිත තොරතුරක් අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත් නොවේ**. කෙසේ වෙතත්, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධ වියදම් සියයට 7 කින් පමණක් ආන්තික වශයෙන් ඉහළ නංවා ඇත.<br>- සමෘද්ධි ප්‍රතිලාභීන් සියලුම දෙනා සඳහා **සමෘද්ධි ජීවිත ඉතුරුම් ගිණුමක් විවෘත කිරීම** සහ සමෘද්ධි ප්‍රතිලාභ මුදල් එම ගිණුම්වලට යොමු කොට රජයේ සුරැකුම්පත්වල නැවත ආයෝජනය කිරීම **සඳහා යෝජනාවක් 2021 අයවැය කතාව මගින් හඳුන්වා දේ**.<br>- **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයන් වෙත ගෙවනු ලැබෙන පුද්ගල පඩිනඩි 2021 දී 19% කින් වැඩි කොට ඇත** (රු. මිලියන 14,278 සිට රු. මිලියන 17,019 දක්වා). මෙය 2020 දී සිදු කරන ලද 11% ඉහළ දැමීමට වඩා වැඩි වටිනාකමකි. |

# III කොටස: තොරතුරු ප්‍රමිතීන් සහ නිසි සුපරීක්ෂාව

වාර්තාවේ මෙම කොටස මගින් අයවැය තොරතුරු ලබා දීමේදී යොදා ගන්නා ලද ප්‍රමිතීන්ට අදාළව අවධානයට ලක් විය යුතු කාරණා ඉදිරිපත් කෙරේ. පෙර වර්ෂවලදී, අයවැය පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තා මාලාවක් හරහා ඉහත කී ආකාරයේ කරුණු කිහිපයක් ම අවධාරණය කරන ලදි. මින් ඇතැම් ගැටළු ඉන් අනතුරුව ඉදිරිපත් කෙරුණු අයවැය යෝජනා තුළින් නිරාකරණය කෙරුණද ඉන් බහුතරයක් සඳහා තවමත් විසඳුම් ලබා දී නොමැත.

**තොරතුරු ප්‍රමිතීන් සහ නිසි සුපරීක්ෂාව** යන්නෙන් අදහස් වන්නේ ලබා දෙන තොරතුරුවල අභ්‍යන්තර සංගතතාව සහ/හෝ වෙන් කරන මුදල් සහ ඒ ආශ්‍රිත වෙනස්කම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම මෙන්ම ඒ සම්බන්ධයෙන් පවතින වෘත්තීමයභාවය හා නිරවද්‍යතාව, ලබා දී ඇති තොරතුරුවල ප්‍රමාණවත්භාවය සහ ඊට පෙර ඉදිරිපත් වූ ගැටලු නිරාකරණය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග ආදිය සම්බන්ධයෙන්  පවතින  අවධානයට ලක් කළ යුතු ප්‍රධාන කාරණා වේ.

මෙම කොටස උප කොටස් දෙකකින් සමන්විත වේ: (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අයවැය සම්බන්ධයෙන් මතු කර ඇති පූර්ව ගැටලු සමාලෝචනය කිරීම සහ (2) අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අයවැය ආශ්‍රිත දුර්වලතා.

# 1. තොරතුරු ආශ්‍රිතව අවධානයට ලක් විය යුතු කරුණු

## 1.1 අයවැය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආංශික වර්ගීකරණයක් නොමැති වීම

අයවැය වියදම් සම්බන්ධයෙන් කෘත්‍යයාත්මක/ආංශික වර්ගීකරණයක් ලබා නොදීමේ ගැටලුව 2018 අයවැය පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව මගින් පළමුව අවධාරණය කෙරිණ. ඉන් අනතුරුව 2019 අයවැය මගින් ආංශික වර්ගීකරණයක් ලබා දීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කළේ ය. කෙසේ වෙතත්, මුදල් අමාත්‍යාංශය විසින් අනුගමනය කරන ලද මෙම ධනාත්මක පියවර 2020 සහ 2021 අයවැය ඇස්තමේන්තුවලින් ඉවත් කර ඇත.

## 1.2 අයවැයෙහි ප්‍රධාන වෙනස්කම් පිළිබඳ පැහැදිලි කිරීමක් කර නොමැති වීම

අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් ප්‍රතිපාදනවලට අදාළ ප්‍රධාන වෙනස්කම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වාර්තා කළ යුතු බවට 2018 අයවැය පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව මගින් නිර්දේශ කරන ලදි. එහි "ප්‍රධාන වෙනස්කම්" යන්න නිර්වචනය කර තිබුණේ අදාළ ප්‍රතිපාදන පවතින වසරේ සිට 20% ඉක්මවමින් වර්ධනය වනු ඇති බවට හෝ 10% ඉක්මවමින් පහත බසිනු ඇති බවට හෝ තක්සේරු කර ඇති අයවැය අයිතම ලෙස ය. වියදම් ආශ්‍රිත සැලකිය යුතු වෙනස්වීම් ඉස්මතු වී පෙනීම එමගින් සිදු වනු ඇතැයි අපේක්ෂිත විය. කෙසේ වෙතත්, 2021 අයවැයෙහි එවැනි අයිතම කිහිපයක් පිළිබඳව පමණක් පැහැදිලි කිරීම් ඇතුළත්ව තිබූ අතර සැලකිය යුතු වෙනස්කම් බොහොමයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කිසිවක් සිදු කර නොමැත. අමාත්‍යාංශ ධුර වෙනස් කිරීම හේතුවෙන් වියදම් ආශ්‍රිත වෙනස්කම් හඳුනා ගැනීම වැඩිදුරටත් අභියෝග කර තත්ත්වයකට පත් විය.

# 2. වෙනත් ගැටලු

## 2.1 සීනි බද්ද

පැණි බීම මත අය කරන ලද සීනි බද්ද ග්‍රෑම් එකකට ශත 50 සිට ග්‍රෑම් එකකට ශත 40 දක්වා අඩු කිරීම සම්බන්ධයෙන් 2019 අයවැය පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙහි ගැටලු මතු කර තිබුණි. එමෙන් ම, මිලිලීටර 100 කට සීනි අන්තර්ගතය ග්‍රෑම් 4 ට වඩා අඩු කාබනේට් පාන සහ මිලිලීටර 100 කට සීනි අන්තර්ගතය ග්‍රෑම් 8 ට වඩා අඩු පලතුරු පාදක බීම වර්ග බදුවලින් නිදහස් කිරීමටද 2019 අයවැය මගින් යෝජනා කෙරිණ. කෙසේ වෙතත්, සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශ කරනුයේ මිලිලීටර 100 කට ග්‍රෑම් 2 ක සීනි අන්තර්ගතයක් සහිත කාබනේට් බීම වර්ග පමණක් එසේ බදුවලින් නිදහස් කිරීමටය. මෙම ප්‍රතිපත්තිය නිසා සමාජයීය මෙන්ම මූල්‍යමය වශයෙන්ද ධනාත්මක ප්‍රතිඵල උදා වන නිසා මෙලෙස බදුවලින් නිදහස් කිරීමේ සීමාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශයට අනුව පවත්වා ගත යුතු බවටත්, බදු අය කිරීම ග්‍රෑම් එකකට ශත 50 ක් ලෙස පවත්වා ගත යුතු බවටත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව යෝජනා කළේ ය.

කෙසේ වෙතත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් මතු කරන ලද කාරණා නොසලකා හරිමින් 2019 මාර්තු 05 දින නිකුත් කරන ලද අංක 2113/9 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය හරහා 2019 අයවැය මගින් යෝජිත බදු අනුපාතික ක්‍රියාත්මක කරන ලදි.

මෙම ගැටලුව තවදුරටත් සංකීර්ණ කරමින් 2020 ඔක්තෝබර් 12 දින නිකුත් කරන ලද අංක 2197/3 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය හරහා ග්‍රෑම් එකකට ශත 40 සිට ශත 30 දක්වා සීනි බද්ද තවදුරටත් අඩු කිරීමට රජය පියවර ගත්තේය. කාබනේට් බීම වර්ග බදුවලින් නිදහස් කිරීම සම්බන්ධයෙන් පනවා තිබුණු සීමාව මිලිලීටර් 100 කට ග්‍රෑම් 4 සිට ග්‍රෑම් 6 දක්වා ඉහළ නංවන ලදි.

## 2.1 ඔට්ටු සහ සූදු බද්ද

ඇ.ඩො. 100 ලෙස පැවති කැසිනෝ හල් සඳහා ඇතුළු වීමේ ගාස්තුව 2019 අයවැය මගින් ඇ.ඩො 50 දක්වා අඩු කෙරුණු අතර, කැසිනෝ සඳහා පනවා තිබුණු බලපත්‍ර ගාස්තුව රු. මිලියන 200 සිට රු. මිලියන 400 දක්වා ඉහළ නංවන ලද අතරම රූජිනෝ ක්‍රීඩා බලපත්‍ර ගාස්තුව රු. මිලියන 200 සිට රු. මිලියන 1 දක්වා අඩු කරන ලදි. මෙලෙස සිදු කළ බදු අඩු කිරීම සම්බන්ධයෙන් වන ගැටලුකාරී තත්ත්වය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. එහෙත් කාරක සභාව විසින් එම කාරණාව මතු කරන ලද්දේ එය සංශෝධනයක් බවට වන වැරදි අර්ථ නිරූපණයක් ඊට ලබා දෙමිනි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගත් බවක් පෙනෙන්නට නැත. බදු වෙනස් කිරීම සම්බන්ධයෙන් දැනුම් දීම උදෙසා කිසිදු ගැසට් නිවේදනයක් හෝ නිල රාජ්‍ය ලේඛනයක් හෝ නිකුත් කර නොමැත. එමෙන් ම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල අඩවියෙහි තවමත් දැක්වෙන්නේ බදු සම්බන්ධයෙන් 2015 දී සිදු කරන ලද යාවත්කාලීනය සම්බන්ධ තොරතුරු පමණි.

## 2.3 සිගරට් බද්ද දර්ශක මත පදනම් කර ගැනීම

"මෙතැන් සිට, දුම්වැටි මත පැනවෙන නිෂ්පාදන බද්ද වාර්ෂිකව ඉහළ දැමීම, අවමයක් ලෙස වාර්ෂික උද්ධමනය හා ද.දේ.නි යේ වර්ධනය සැලකිල්ලට ගන්නා අයුරින් දර්ශක මත පදනම්ව සිදු කෙරෙනු ඇති" යන්න 2019 අයවැය මගින් යෝජනා වී තිබේ.

කෙසේ වෙතත්, 2020 හා 2021 උද්ධමනයට සහ ද.දේ.නි. ආශ්‍රිත අපේක්ෂාවලට අනුකූල වන පරිදි දුම්වැටි බද්ද සම්බන්ධයෙන් කිසිදු වෙනස්කමක් වත්මන් අයවැය මගින් සිදු කර නොමැත. 2021 අයවැය මගින් දුම්වැටි හෝ මත්පැන් ආශ්‍රිත බදු සම්බන්ධයෙන් කිසිදු ඉහළ නැංවීමක් සිදු නොකරයි. ඒ වෙනුවට, දුම්වැටි සහ මත්පැන් ඇතුළු නිෂ්පාදන මාලාවක්ම මත භාණ්ඩ හා සේවා බද්දක් අය කිරීමට ඉන් යෝජනා වී ඇත. කෙසේ වෙතත්, ඊට අදාළ බදු අනුපාතික කිසිවක් දක්වා නොමැති අතර එම හේතුව නිසා නව භාණ්ඩ හා සේවා බද්ද හේතුවෙන් සඵලදායී බදු අනුපාතිකයෙහි ඉහළ යාමක් වේද, පහළ යාමක් වේද යන්න පැහැදිලි ලෙස වටහා ගත නොහැක. මෙම වාර්තාව පළ කරන අවස්ථාව වන විට භාණ්ඩ හා සේවා බද්ද ක්‍රියාත්මක කර නොතිබිණ.

# 3. අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අයවැය ආශ්‍රිත දුර්වලතා.

විවෘත අයවැය සමීක්ෂණය වනාහි ප්‍රධාන පැතිකඩ තුනකට සාපේක්ෂව කිසියම් රටක අයවැය ක්‍රියාවලිය පිළිබඳව සිදු කෙරෙන ජාත්‍යන්තර අධ්‍යයනයකි. එනම්: අයවැයෙහි විනිවිදභාවය, අයවැය අධීක්ෂණය සහ මහජන සහභාගීත්වය යන පැතිකඩ තුන යි. මෙම සමීක්ෂණයේ ආසන්නතම වටය 2019 දී පළ කරන ලද අතර එමගින් රටවල් 117 ක් ආවරණය කෙරිණි.

විවෘත අයවැය දර්ශකය යනු ඒ ඒ රටවල අයවැය ආශ්‍රිත විනිවිදභාවයේ මට්ටම පිළිබඳ ලකුණු පාදක ශ්‍රේණිගත කිරීමක් වන අතර එය විවෘත අයවැය සමීක්ෂණයේ ප්‍රධානතම සංරචකය වෙයි. 2019 වසර සඳහා ශ්‍රී ලංකාවේ විවෘත අයවැය දර්ශකය සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය 100 න් 41 ක් වූ අතර මෙය ප්‍රමාණවත් තොරතුරු මට්ටමක් පවතින බවට සැලකෙන අවම ලකුණු ප්‍රමාණය වන 61 න් පහළ පිහිටීමකි. සමීක්ෂණයේ ගත වූ වට තුන පුරාවට ශ්‍රී ලංකාව විවෘත අයවැය දර්ශකය වෙනුවෙන්ලබා ගත් ලකුණු සංඛ්‍යාව ආශ්‍රිතව ඉහළ නැගීමේ නැඹුරුවක් පෙන්නුම් කළද ඊට අදාළ වැඩිදියුණු වීම් මන්දගාමී ස්වභාවයක් ගෙන තිබේ.


2019 විවෘත අයවැය සමීක්ෂණයට අනුව එය විසින් නිරීක්ෂණයට ලක් කරන ලද අයවැය ලේඛන 8 අතරින් 6 ක් ශ්‍රී ලංකාව විසින් පළ කර තිබුණි. කෙසේ වෙතත්, එකී ලේඛන මගින් සිදු කළ තොරතුරු හෙළිදරව් කිරීම දුර්වල ලෙස පැවති හෙයින් විවෘත අයවැය දර්ශකය සම්බන්ධයෙන් එහි කාර්යසාධනය දුර්වල එකක් විය. විශේෂයෙන් ම, පුරවැසි අයවැය, වසර තුළ වාර්තා සහ විගණන වාර්තාව යනාදිය අංගසම්පූර්ණභාවය අතින් අඩු ලකුණු ලබා ගෙන තිබුණි. අයවැය ඇස්තමේන්තු සඳහා ලකුණු 60ක් ලැබුණද එයද 61 ක් වූ අවම ලකුණට වඩා සුළු වශයෙන් පහළින් පවතින අගයකි.

මෙම වාර්තාව පුරාවටම අවධාරණය වූ පරිදි, අයවැය ඇස්තමේන්තුවල තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සිදු කළ යුතුව පවතී. ගෝලීය නිසි පරිචයන් සමඟ සංසන්දනය කිරීමේදී අයවැය ඇස්තමේන්තුවල සඳහන්ව

නොමැති පහත තොරතුරු පිළිබඳ 2019 විවෘත අයවැය සමීක්ෂණය අවධාරණය කරයි.


1. වියදම් පිළිබඳ කෘත්‍යයාත්මක වර්ගීකරණය
2. වසර අවසානය වන විට හිඟ ණයෙහි මුළු සංයුතිය (පොලී අනුපාත, කල්පිරීම් පිළිබඳ විස්තර, එම ණය දේශීයද විදේශීයද යන වග ආදිය ඇතුළත්ව).
3. අයවැය පිළිබඳ සාර්ව ආර්ථික උපකල්පනයන් පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය.
4. අමතර අයවැය අරමුදල් පිළිබඳ තොරතුරු.
5. මධ්‍යම ආණ්ඩුවේ ඒකාබද්ධ මූල්‍ය කටයුතු (අයවැය සහ අමතර අයවැය යන දෙවර්ගයම).
6. විවිධ ජනගහණ කණ්ඩායම් මත මූල්‍යමය බලපෑම විදහා දක්වනු පිණිස වියදම් සම්බන්ධ විකල්ප නිරූපණයන් (ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආදායම හෝ කලාපය අදී සාධක ඇසුරින්).
7. රජයේ මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම්.
8. අයවැය වර්ෂය සඳහා වූ වියදම් හිඟයන්.
9. රජයේ අනාගත වගකීම් සහ දිගු කාලීනව එහි මූල්‍ය කටයුතුවල තිරසාරබව තක්සේරු කිරීම.
10. පූර්වෝදිෂ්ට ආදායම් ඇස්තමේන්තු.

**සිද්ධි අධ්‍යයනය:** යුක්රේනය සහ ශ්‍රී ලංකාව පිළිබඳ විවෘත අයවැය දර්ශක ලකුණු




2010 වසර සඳහා සිදු කරන ලද විවෘත අයවැය සමීක්ෂණයට අනුව සමීක්ෂණයේ අවම මට්ටම වූ 61 ට වඩා ඉහළින් ලකුණු ලබා ගැනීමට යුක්රේනය සහ ශ්‍රී ලංකාව යන රටවල් දෙකම සමත් වී ඇත. කෙසේ වෙතත්, ඉන් පසු වසරවලදී ගෝලීය තොරතුරු ප්‍රමිතීන් වැඩිදියුණු වීම දිගින් දිගටම සිදු වීමත් සමගම මෙම රටවල් දෙකම අනෙකුත් රටවලට වඩා පසුගාමී තත්ත්වයකට පත්ව තිබේ.

විවෘත සමීක්ෂණ දර්ශකයේ ලකුණු 47ක් ලැබීම මගින් දැක්වෙන පරිදි 2019 වසරේදීද ශ්‍රී ලංකාව විසින් සිය අයවැය ක්‍රියාවලියට අදාළ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොමැත. එහෙත්, යුක්රේනය මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර සමීක්ෂණයේ ගත වූ වට තුන පුරාවටම විවෘත සමීක්ෂණ දර්ශකයට අදාළව ලබා ගත් ලකුණු ප්‍රමාණය වර්ධනය වීමෙන් එය පෙන්නුම් කෙරේ. 2019 වසරේදී විවෘත සමීක්ෂණ දර්ශකයේ ලකුණු සීමාව වූ 61 පසු කිරීමට යුක්රේනය සමත් විය. මෙම වෙනස්කම් සිදු වූ කාල වකවානුව තුළදී යුක්රේනයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ශ්‍රී ලංකාවේ පැවැති තත්ත්වයට වඩා පසුගාමීව තිබූ තත්ත්වයක් තුළ වුවද එරට අයවැය විනිවිදභාවය සම්බන්ධයෙන් මෙම වැඩිදියුණු වීම් සිදු වීම සැලකිය යුතු කරුණකි.




*මූලාශ්‍රය: ලෝක බැංකුවේ විවෘත දත්ත*

යුක්රේනයේ අයවැය තොරතුරු හෙළිදරව් කිරීම් ආශ්‍රිත වර්ධනය, එරට ආණ්ඩුව විසින් රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් හඳුන්වා දෙන ලද අංග සම්පූර්ණ ප්‍රතිසංස්කරණ නිසා සිදු වූ බවක් කිව හැක.[9] යුක්රේනයේ මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2017-2020 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති ප්‍රතිසංස්කරණ උපායමාර්ගය මගින් ක්ෂේත්‍ර කිහිපයක්ම ඉලක්කගත කෙරුණු අතර ඉන් එකක් වූයේ විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීමයි. රාජ්‍ය මූල්‍ය විනය ඉහළ නැංවීම, සඵලදායී ලෙස සම්පත් වෙන් කිරීම සහ අයවැය ක්‍රියාත්මක කිරීම ආදිය එකී ප්‍රතිසංස්කරණ උපායමාර්ගයේ අනෙකුත් අංග අතරට ඇතුළත් විය.[10]

රජය විසින් දරනු ලැබෙන විස්තීර්ණ ප්‍රයත්නයක් තුළින් රාජ්‍ය මූල්‍ය ආශ්‍රිතව වැඩිදියුණු කිරීම් සිදු කිරීමට ඇති හැකියාව මෙම සිද්ධි අධ්‍යයනය මගින් දැක් වේ. යුක්රේනයට සමාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ උපායමාර්ගයක් මගින් නිරාකරණය කෙරෙන ක්ෂේත්‍ර සියල්ල ආශ්‍රිත දුර්වලතා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ස්වකීය වාර්තා මගින් අවධාරණය කර ඇත. කෙසේ වෙතත්, ගත වූ වසරවලට අදාළව ශ්‍රී ලංකාවට හිමි වී ඇති විවෘත සමීක්ෂණ දර්ශක ලකුණු ආශ්‍රිත වෙනස්කම්වලට සමාන අයුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ ප්‍රතිසංස්කරණවල ප්‍රගතියද මන්දගාමී වී තිබේ.

9 ජාත්‍යන්තර අයවැය හවුල්කාරිත්වය (2019), විවෘත අයවැය සමීක්ෂණ වාර්තාව, මෙහි ලබා ගත හැකිය https://www.internationalbudget.org/sites/default/files/2020-04/2019_Report_EN.pdf

10 යුක්රේන මුදල් අමාත්‍යාංශය (2017), රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති ප්‍රතිසංස්කරණ උපායමාර්ගය 2017-2020, මෙහි ලබා ගත හැකිය https://www.mof.gov.ua/storage/files/f0c37541b6bc06ccae09b784d802dc9d.pdf

ISBN 978-624-5514-05-2

Verité Research
Strategic Analysis for Asia

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org